# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2019

**ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා,සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය**

වැය ශීර්ෂ අංකය: 157

# පටුන


පළමු වන පරිච්ඡේදය ........................................................................................ 1

ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය ........................................................ 1

1.1 හැඳින්වීම ........................................................................................ 3

1.2 දැක්ම, මෙහෙවර, අරමුණු ........................................................................ 3

1.3 ප්‍රධාන කාර්යයන් ................................................................................ 4

1.4 අමාත්‍යාංශයේ සංවිධාන සටහන- 2019 .................................................... 5

1.5 අමාත්‍යංශය යටතේ පවතින දෙපාර්තමේන්තු .................................................. 7

1.6 අමාත්‍යංශය යටතේ පවතින ආයතන .......................................................... 7

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු .................................................. 8

දෙවන පරිච්ඡේදය ........................................................................................ 9

ප්‍රගතිය හා ඉදිරි දැක්ම .................................................................................. 9

2.1 අමාත්‍යාංශයේ කාර්යසාධනය 2019 ............................................................ 11

2.1.1 ජාතික ඒකාබද්ධතා අංශය .................................................................... 13

2.1.2 භාෂා අයිතිවාසිකම් අංශය. .................................................................. 18

2.1.2 පාලන අංශය .................................................................................... 20

2.1.3 සැලසුම් අංශය .................................................................................. 20

2.1.4 ගිණුම් අංශය .................................................................................... 20

2.1.5 අභ්‍යන්තර විගණන අංශය ...................................................................... 21

2.1.6 සංහිදියාව අරමුණු කරගත් ආර්ථික සවිබල ගැන්වීම හා සමාජ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය ........................................................................................ 22

2.1.7 සංවර්ධන සහය ව්‍යාපෘති ........................................................................ 24

2.1.8 දිස්ත්‍රික් සංහිඳියා කමිටු ........................................................................ 26

2.1.9 අතුරුදහන් වීම පිළිබඳ සහතිකය ලද ග්‍රාහකයන් සඳහා රු 6000.00 ක අතුරු සහනාධාරයක් ප්‍රදානය කිරීම ........................................................................................ 27

2.2අමාත්‍යාංශයට අයත් ආයතනයන්හි කාර්යසාධනය 2019 ........................................ 29

2.2.1 රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව .................................................................. 31

හැඳින්වීම ........................................................................................ 31

2.2.2 රාජ්‍ය භාෂා කොමිෂන් සභාව .................................................................. 31

2.2.3 ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය හා එහි ප්‍රගතිය .................................. 32

2.2.4 රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය .................................. 35

2.2.5 ජාතික සමගිය හා සංහිදියා කාර්යංශය ( ONUR ) හා එහි ප්‍රගතිය. .......................... 39

2.2.6 හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ...................................... 41

2.2.6 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ........ 42
තුන්වන පරිච්ඡේදය ........ 45
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය ........ 45
3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ........ 47
3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ........ 48
3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ........ 49
3.5 මූල්‍ය ප්‍රකාශ සටහන් ........ 50
3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය ........ 51
3.7වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය ........ 51
3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන .. 52
3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ........ 52
3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව ........ 53
හතර වන පරිච්ඡේදය ........ 65
කාර්ය සාධන දර්ශක ........ 65
4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) ........ 67
පස්වන පරිච්ඡේදය ........ 73
තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය ........ 73
හයවන පරිච්ඡේදය ........ 79
මානව සම්පත් පැතිකඩ ........ 79
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය ........ 81
6.3 මානව සම්පත් සංවර්ධනය ........ 82
සත්වන පරිච්ඡේදය ........ 87
අනුකූලතා වාර්තාව ........ 87

# පළමු වන පරිච්ඡේදය

# ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

අංක 1945/40 සහ 2015.12.18 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය ලෙස ස්ථාපිතව පැවැති මෙම අමාත්‍යාංශය අංක 2070/56 සහ 2018.05.12 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් ජාතික ඒකාබද්ධතා, සංහිඳියා හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය ලෙස සංශෝධනය විය.නැවත අංක 2103/33 හා 2018.12.28 දිනැති ගැසට් නිවේදනය මගින් පුළුල් විෂයය ක්ෂේත්‍රයක් හා ආයතන 07 ද සහිතව ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය ලෙස ස්ථාපිතව ක්‍රියාත්මක විය.

ජාතික ඒකාබද්ධතා,රාජ්‍ය භාෂා,සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු ගරු අමාත්‍යවරයා ලෙස මනෝ ගනේසන් මැතිතුමා ද අමාත්‍යාංශ ලේකම් ලෙස ඒ.එස්.එම්.එස් මහානාම මිය ද කටයුතු කරන ලදී.

2019.12.**10** දිනෙන් පසු අධිකරණ මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාශය වෙත සහජීවන විෂයය පථයත් ,රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත රාජ්‍ය භාෂා විෂයය පථයත් ගැසට් වූ අතර ජාතික ඒකාබද්ධතා ප්‍රතිසන්ධාන අංශය ලෙස අංක 40, බුත්ගමුව පාර, රාජගිරිය යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන අතර රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන් මොහාන් ද සිල්වා මහතා හා රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් ලෙස ගීතාමනි සී කරුණාරත්න මිය කටයුතු කරනු ලබයි.

## 1.2 දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

විවිධත්වය ශක්තියක් වූ සහජීවනය ප්‍රතිෂ්ඨාපනය වූ සියලු ජන සංස්කෘතික අනන්‍යතාවයන් පෝෂණය කරන්නා වූ ශ්‍රී ලාංකේය ජාතියක්

### මෙහෙවර

සෑම ජන කණ්ඩායමකම අයිතීන් තහවුරු කරන්නාවූත් එකිනෙකාට ගරු කරන්නාවූත් සහයෝගීතාවය සහ සහජීවනය සහිත සංවර්ධිත සමාජයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය ,සංවාද ඇති කිරීම, මග පෙන්වීම, පහසුකම් සැලසීම සහ ඊට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

අමාත්‍යාංශයේ අරමුණු

- රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අරභයා රාජ්‍ය ආයතන සවිබල ගැන්වීම.
- ශ්‍රී ලංකාව තුළ ත්‍රෛභාෂා භාවිතය දිරිගැන්වීම හා ප්‍රවර්ධනය කිරීම.
- ජාතික සහජීවන ක්‍රියාදාමය සඳහා අවශ්‍ය නායකත්වය හා පහසුකම් සැපයීම.
- ජාතික සහජීවනය නැංවීම හා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සංවිධාන සම්බන්ධීකරණය


## 1.3 ප්‍රධාන කාර්යයන්

- ජාතික සංවාද විෂයයට සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- ජාතික භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා ඒ සම්බන්ධ කටයුතු.
- ජාතීන් අතර සහයෝගිතාව සහ සහජීවනය ප්‍රතිෂ්ඨාපනය සඳහා අවශ්‍ය සංවාද වැඩසටහන් හඳුන්වා දී ක්‍රියාවට නැංවීම.
- ප්‍රධාන ජාතික භාෂාවන් හා සන්ධාන භාෂාව උපයෝගී කර ගනිමින් ජාතීන් අතර සමාජමය හා ආගමික පසුබිම අන්‍යෝන්‍යවශයෙන් අවබෝධ කර ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම.

## 1.4 අමාත්‍යාංශයේ සංවිධාන සටහන- 2019

**ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා,සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශ**

**සංවිධාන සටහන**



1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

1. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
   දු ක. 011-2888934
   ෆැක්ස් 011-2883930
   විද්‍යුත් තැපැල comm@languagesdept.gov.lk

2. හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

   දු ක. 011-2552643
   ෆැක්ස් 011-2552824
   විද්‍යුත් තැපැල

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

1. රාජ්‍ය භාෂා කොමිෂන් සභාව
   දු ක. 011-2889482
   ෆැක්ස් 011-2875830
   විද්‍යුත් තැපැල olcommission@gmail.com

2. ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය
   දු ක. 011-3092910
   ෆැක්ස් 011-2884612
   විද්‍යුත් තැපැල nilet@sltnet.lk

3. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය
   දු ක. 011-2877376
   ෆැක්ස් 011-2884612
   විද්‍යුත් තැපැල ngosecretarialtsl@gov.lk k

4. ජාතික සමඟිය හා සංහිඳියා කාර්යාංශය\

   දු ක. 011-2343501
   ෆැක්ස් 011-4355418
   විද්‍යුත් තැපැල nilet@sltnet.lk

5. අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය
   දු ක. 011-3687333
   ෆැක්ස් 011-2667098
   විද්‍යුත් තැපැල

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

| | ව්‍යාපෘතියේ නම | දායක නියෝජිතායතනය | ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - රු. මි. | ව්‍යාපෘති කාල සීමාව |
|---|---|---|---|---|
| 01 | මූලාරම්භය ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් තුළින් සාමකාමී අන්තර් සම්බන්ධතා පවත්වා ගෙන යාමේ ව්‍යාපෘතිය (USAID) | USAID | 209.00 | 2018-2022 |
| 02 | ජාතික භාෂා සමානාත්මතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | CANADA | 1460.00 | 2018-2023 |
| 03 | සමාජ සහජීවනය හා ප්‍රතිසන්ධාන ව්‍යාපෘතිය (SCORE) USAID | USAID | 1780.00 | 2019-2021 |
| 04 | ශ්‍රී ලංකාවේ සංහිඳියා ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (SRP) | EU | 3018.00 | 2018-2021 |
| 05 | යාපනය දිස්ත්‍රික්කයේ වැසි ජලය එක්රැස් කිරීමේ පද්ධති ඉදිකිරීමේ ව්‍යාපෘතිය (ONUR) | INDIA | 300.00 | 2017-2021 |

# දෙවන පරිච්ඡේදය

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

# 2.1 අමාත්‍යාංශයේ කාර්යසාධනය 2019

### 2.1.1 ජාතික ඒකාබද්ධතා අංශය

**හැඳින්වීම**

ජාතික ඒකාබද්ධතා අංශය මඟින්, ජාතීන් අතර සහයෝගිතාවය සහ සහජීවනය ප්‍රතිෂ්ඨාපනය සඳහා අවශ්‍ය වැඩසටහන් හඳුන්වා දී ක්‍රියාවට නැංවීම සහ ජාතීන් අතර සංස්කෘතික, සමාජීය හා ආගමික පසුබිම අන්‍යෝන්‍ය වශයෙන් අවබෝධ කරගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම සිදු කරනු ලබයි.

ඒතුළින් ශ්‍රී ලාංකේය සමාජයේ ජීවත්වන සියලු ජනවර්ග සහ ජන කණ්ඩායම්වල උරුමයන්, අනන්‍යතාවයන් සහ සංස්කෘතීන් ආරක්ෂා කරමින් වැඩසටහන් පැවැත්වීම සිදු කෙරේ.

**ජාතික ඒකාබද්ධතා අංශයේ කාර්යයන්**

- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ජාතික ඒකාබද්ධතාවය ප්‍රවර්ධනයට අදාළ ක්‍රියාකාරකම්ක්‍රියාවට නැංවීම.
- ජාතීන් අතර සහයෝගීතාවය හා සහජීවනය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා අවැසි වැඩසටහන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
- සමාජයේ ආන්තීකරණයට ලක් වූ කණ්ඩායම් සවිබල ගැන්වීම තුළින් ජාතික ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාරවරුන් මඟින් අදාළ දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල පවතින ජාතික ඒකාබද්ධතාවය හා සම්බන්ධ ගැටලු හඳුනාගෙන ඒ සඳහා අවැසි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධනය කිරීමට අදාළ පාර්ශවකරුවන් සමඟ විවිධ මට්ටමින් සංවාද වැඩසටහන් පැවැත්වීම.

**සහජීවන සංගම් ව්‍යාපෘති හා වෙනත් ව්‍යාපෘති**

රටේ වර්තමාන අවශ්‍යතාව සහ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව විවිධ ජනවාර්ගිකයන් අතර ඒකාබද්ධතාව, සහජීවනය හා සංහිඳියාව ඇති කරමින් ශ්‍රී ලාංකික ජාතියක් නිර්මාණය කිරීමට අවශ්‍ය පරිසරය සැකසීම ජාතික ඒකාබද්ධතාවය හා ප්‍රතිසන්ධානය පිළිබඳ අංශයයේ කාර්යභාරයකි. එම කාර්යය ඉටු කරගැනීම සඳහා ජාතික සහජීවනය, සංස්කෘතිය, කලාව, භාෂාව, ආගමික හා සංස්කෘතික උත්සව, ක්‍රීඩා , සහ ආන්තීකරණයට ලක් වූ පිරිස් සවිබල ගැන්වීම වැනි පුළුල් පරාසයන් ඔස්සේ විහිදී ඇති අරමුණු සහිතව සමාජයේ බිම් මට්ටමින් පිහිටුවා ඇති සහජීවන සංගම් උපකාර වේ.

සහජීවනය ප්‍රවර්ධනයට සහ භාෂාව ඉගෙන ගැනීම සඳහා උනන්දුවක් දක්වන සාමාන්‍ය ජනතාවගෙන් සහජීවන සංගම් ස්ථාපිත කර ඇත. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් තුළ ස්ථාපිත කරන මෙවැනි මූලික සහජීවන සංගම්වල සභාපතිවරුන් සහ ලේකම්වරුන්ගේ එකතුවෙන් ප්‍රාදේශීය සහජීවන සංගම් ස්ථාපිත කරන අතර ප්‍රාදේශීය සහජීවන සංගම් සභාපතිවරුන් සහ ලේකම්වරුන් ගේ එකතුවෙන් හා දිස්ත්‍රික් ලේකම්ගේ උපදේශකත්වයෙන් දිස්ත්‍රික් සහජීවන සංගම් පිහිටුවා ගනී.

සියලුම දිස්ත්‍රික් සහජීවන සංගම්වල එකතුවෙන් ජාතික මහා සමුළුව ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරන අතර එය සම්බන්ධීකරණය ජාතික ඒකාබද්ධතාවය හා ප්‍රතිසන්ධානය පිළිබඳ අංශය විසින් සිදු කරනු ලැබේ. මෙලෙස පිහිටුවා ගන්නා ලද සහජීවන සංගම් ප්‍රාදේශීය මට්ටමින් පවතින රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන, ස්වෙච්ඡා සංවිධාන හා සිවිල් සංවිධාන සමඟ ඒකාබද්ධ වී විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති සිදු කරනු ලබයි.

කුඩා ව්‍යවසායකයන්ට ජීවනෝපාය මාර්ග ප්‍රවර්ධනය කිරීම, ආන්තීකරණයට ලක් වී

ඇති පුද්ගලයින් හෝ ජන කොටස් සමාජගත කිරීමට අවශ්‍ය සුභ සාධන සඳහා පහසුකම් සැපයීම, රාජ්‍ය භාෂාවන් වන සිංහල/දෙමළ හා සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි භාෂා භාවිතය ප්‍රවර්ධනය කිරීම, සමාජය තුළ නීති විරෝධී මත් ද්‍රව්‍ය හා ආයුධ සංස්කෘතිය පිටු දැකීම සඳහා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්, අධ්‍යාපනය, සංස්කෘතිය, කලාව, ආගමික සහ ක්‍රීඩා ක්ෂේත්‍ර නගාසිටුවීම මෙන්ම ප්‍රාදේශීය වශයෙන් අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති මගින් ප්‍රාදේශීය මට්ටමින් ප්‍රතිලාභ රැසක් ජනතාවට හිමි වී ඇත. 2019 වර්ෂය තුළ සහජීවන සංගම් හරහා මෙන්ම වෙනත් ව්‍යාපෘතින්ද 72ක් සිදු කිරීම සඳහා රුපියල් මිලියන 5.81ක මූල්‍ය ප්‍රතිපාදන ජාතික ඒකාබද්ධතාවය හා ප්‍රතිසන්ධානය පිළිබඳ අංශය විසින් ලබා දී ඇත.

**මාධ්‍යය තුළින් සහජීවනය ඇති කිරීම - සුභාරතීගුවන් විදුලි වැඩසටහන**

ජාතික ඒකාබද්ධතාවය හා ප්‍රතිසන්ධානය පිළිබඳ අංශයේ අරමුණු සහ කාර්යයභාරයන් වන ජාතික ඒකාබද්ධතාවය, සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම යනාදී කරුණු මහජනයා අතර මාධ්‍ය වැඩසටහන් ඔස්සේ ප්‍රචලිත කිරීම කාලීන අවශ්‍යතාවයකි. මාධ්‍ය වැඩසටහන් අතරින්ද ගුවන් විදුලි වැඩසටහන් ප්‍රමුඛස්ථානයක් ගන්නා අතර අමාත්‍යාංශයේ අරමුණු,පරමාර්ථ හා අමාත්‍යාංශයට අයත් අනුබද්ධ ආයතනවල කාර්ය භාරය මහජනයා වෙත ගෙන යාම සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සිංහල ස්වදේශීය සේවය ඔස්සේ සුභාරතී ගුවන් විදුලි වැඩසටහන සිංහල මාධ්‍යයෙන් ද දෙමළ ස්වදේශීය සේවය ඔස්සේ විඩියුම් වේලෙයි ගුවන් විදුලි වැඩසටහන දෙමළ මාධ්‍යයෙන්ද සෑම සඳුදා දිනකම (පොහොය දින හැර) පෙ.ව 7.00 සිට 8.00 දක්වා විකාශය වේ.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට අයත් සේවාවන් 10 ක් ඔස්සේ සෑම ප්‍රධාන



ප්‍රවෘත්ති ප්‍රචාරයකටම පෙර ප්‍රචාරය වන ප්‍රවෘත්ති පූර්ව නිවේදයන් මඟින් ජාතික ඒකාබද්ධතාව සහ සහජීවනය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් සකස් කරන ලද අමාත්‍යාංශයේ පණිවිඩ ප්‍රචාරය කිරීම සිදු වේ. ප්‍රවෘත්ති ප්‍රචාරය බහුතරයක් ශ්‍රාවකයන් ශ්‍රවණය කරන බැවින් ජාතික ඒකාබද්ධතාවය හා එය නඟා සිටුවීම සඳහා අමාත්‍යාංශය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව මහජනතාවගේ දැනුවත්භාවය වැඩිකරලීම උදෙසා සෑම ප්‍රවෘත්ති ප්‍රචාරයකටම පෙර ප්‍රචාරය කරන ප්‍රවෘත්ති පූර්ව නිවේදන මගින් පිටුවහලක් ලැබේ.

2019 වර්ෂයේ සිංහල හා දෙමළ මාධ්‍ය ගුවන්විදුලි වැඩසටහන් 90 ක් සිදු කරන ලද අතර මේ සඳහා රුපියල් මිලියන 13.7ක මුදලක් වැය වී ඇත. මාතලේ, ත්‍රිකුණාමලය, මඩකලපුව සහ මහනුවර යන දිස්ත්‍රික්ක සඳහා එම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සිට සජීවී විකාශනය ලබා දෙන ලදී.

**නීතිමය ලේඛන ලබාදීමේ ජංගම සේවය**

ජනවාර්ගික බේදයකින් තොරව සියළු ශ්‍රී ලාංකිකයන් අතරෙහි අන්‍යෝන්‍ය විශ්වාසය වර්ධනය කරමින් සමාජයේ ආන්තීකරණයට ලක් වූ ජන කණ්ඩායම්වලට සමාන ඉඩ ප්‍රස්ථා ලබා දීම තුළින් පුරවැසියකු ලෙස සමාජයේ ජීවත් වීමට අවශ්‍ය මූලික නෛතික ලේඛන ලබා දීම සහ රාජ්‍ය ආයතනයන්ගෙන් ලබා ගත

හැකි සේවාවන් එක් ස්ථානයකින් ලබා දීම මෙම වැඩසටහනෙහි අරමුණු වේ.



මේ සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, මානව හිමිකම් කොමිෂන් සභාව, රාජ්‍ය භාෂා කොමිෂන් සභාව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලීසිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සේවක අර්ථසාධක අරමුදල, නීති ආධාර කොමිෂන් සභාව, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂක මණ්ඩලය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය, නගර සභා/ ප්‍රාදේශීය සභා, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය යන රාජ්‍ය ආයතන නියෝජනය කරමින් නිලධාරීන් සහභාගී වේ.

එකම ස්ථානයකදී මෙම සියලු සේවාවන් ජනතාවට බාධාවකින් තොරව ලබා ගැනීමට අවශ්‍ය සියලු පහසුකම් සපයන අතර මෙම සේවාවන් සියල්ල ජනතාවට නොමිලේ ලබා දෙනු ලැබේ. උදාහරණයක් වශයෙන් ජාතික හැඳුනුම්පතට අවශ්‍ය ඡායාරූප හා මුද්දර සඳහා අවශ්‍ය ගාස්තුද, උප්පැන්න, විවාහ හා මරණ සහතික වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු හා නව විවාහ වීම්වලට අදාළ ගාස්තු ද ගෙවීමකින් තොරව එම සේවාවන් මහජනතාවට නොමිලේ ලබා ගැනීමේ හැකියාව ඇත.මෙමගින් ජනතාවට ඉතා කෙටි කාලයක් තුළ තමන්ට අවශ්‍ය සේවාවන් ලබාගැනීමට හැකියාව ලැබේ. මෙහිදී ලබා දෙනු ලබන සේවාවන් පහත පරිදි වේ.

- ජාතික හැඳුනුම්පත් ලබා දීම සඳහා කටයුතු සිදු කිරීම
- උප්පැන්න සහතිකපත් ලබාදීම, කල්පසු උපත් ලියාපදිංචිය, සංශෝධනය, අනුමාන වයස් සහතික නිකුත් කිරීමට කටයුතු කිරීම සහ උපත්/මරණ/විවාහ සහතිකපත් නිකුත් කිරීම.
- නව විවාහ ලියාපදිංචිය - මෙහිදී අවිවාහකව එකට ජීවත්වන පුද්ගලයින් සඳහා නොමිලේ විවාහ ලියාපදිංචි කිරීම සිදු කරනු ලැබේ.
- අස්ථානගතවූ හැඳුනුම්පත් සඳහා පොලිස් වාර්තා නොමිලේ නිකුත් කිරීම
- සාම විනිසුරු සහතික නිකුත් කිරීම - මෙහිදී ජාතික හැඳුනුම්පත් සහ උප්පැන්න, මරණ හා විවාහ සහතිකවලට අදාළ දිවුරුම් ප්‍රකාශන ලබා දීමට කටයුතු කරනු ලැබේ.
- වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම- ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් ඡායාරූප නොමිලේ ලබා දී වැඩිහිටි හැඳුනුම්පත් ලබාදීමට කටයුතු කිරීම සිදු කරයි.
- තමාට අවශ්‍ය භාෂාවකින් (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)
- උප්පැන්න/මරණ/විවාහ ඇතුළු නීතිමය ලියවිලි පරිවර්තනය කිරීම.
- සේවක අර්ථ සාධක ගැටළු ඉදිරිපත් කිරීම
- ජල බිල්පත් සම්බන්ධ ගැටළු විසඳීම
- නීති ආධාර ලබා දීම
- විදුලිබල සම්බන්ධව ගැටළු.
- නගර සභා වරිපනම් ගැටලු සඳහා තක්සේරු අංශයේ සේවා ලබා දීම.

2019 වර්ෂය තුළ රුපියල් මිලියන 12.1ක වියදමින් ගම්පහ, මඩකළපුව, මාතලේ, කළුතර, කොළඹ, යාපනය සහ කෑගල්ල යන දිස්ත්‍රික්කවලට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 12ක නීතිමය ලේඛන ලබාදීමේ ජංගම සේවා වැඩසටහන් පවත්වා ඇති අතර එමගින් පුද්ගලයින් 9940කට සේවා ලබා ගැනීමේ පහසුකම්

සලසා ඇත. මෙම ජංගම සේවාවන් මගින් ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ජනතාවට ඉමහත් සේවයක් ඉටු වී ඇත.

**ජාතික ඒකාබද්ධතා වැඩසටහන ක්‍රියාත්මක කිරීම**

ජාතික ඒකාබද්ධතාවයෙන් සපිරි සමාජයක් ගොඩනැංවීම සඳහා ප්‍රථම කොට රටේ ජනතාවගේ මූලික අවශ්‍යතා ඉටු කිරීම කෙරෙහි අවධානය යොමු විය යුතු ය. එම මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීමට නොහැකි වීම මඟින් ඇතිවන සමාජ බලපෑම රටේ තිරසාර සංවර්ධනයට බාධකයක් වේ. භෞතික හා මානව සම්පත් බෙදීයාමේ විෂමතාව සහ ආර්ථික දුෂ්කරතා මත අප රටේ ජනතාව සමාජ ආන්තීකරණයට ලක් වී ඇත. අධ්‍යාපනය, රැකියාව, සමාජ පසුබිම, ස්ත්‍රී/පුරුෂ භාවය, ආර්ථික තත්වය ආදි විවිධ හේතූන් මත වැඩිහිටියන්, කාන්තාවන්, පුරුෂයන්, දරුවන් වැනි කණ්ඩායම් එසේ ආන්තීකරණය ලක් විය හැකිය.

ඒ අනුව සියලු දරුවන්ට සම අධ්‍යාපන අයිතිය ලබා දීම යටතේ ආන්තීකරණයට ලක් වී ඇති ජන කණ්ඩායම්වල දරුවන්ට අධ්‍යාපනය සඳහා ප්‍රවේශවීමට පහසුකම් සැලසීම සඳහා දෙමාපියන් අහිමි හෝ එක් භාරකරුවකු සිටින හෝ නාගරික දුප්පත් පාසල් දරුවන් සඳහා පාසල් උපකරණ කට්ටල හා නිළ ඇඳුම් ලබා දීමේ වැඩසටහනක් මගින් සිදු කරනු ලබයි.



තවද ජාතික ඒකාබද්ධතාවය හා ප්‍රතිසන්ධානය පිළිබඳ අංශයමඟින් දෙවන බස පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීමේ “බස වඩමු හද දිනමු”වැඩසටහන සඳහා සම්බන්ධ වන පාසල් සිසුන්සඳහාද ඔවුන් දිරිමත් කිරීමේ අරමුණින් මෙම පාසල් උපකරණ කට්ටල හා නිල ඇඳුම් ලබා දීම සිදු කෙරිණි. මෙමගින් අඩු වරප්‍රසාද ලත් දරුවන් ගේ ඉගනීමට පහසුකම් ලබා දීමෙන් ඔවුන් අධ්‍යාපනය සඳහා යොමු කිරීමත්, සමාජය තුළ පීඩාවට පත් විය හැකි කණ්ඩායම්වල දැනුම, හැකියාව ආකල්ප වර්ධනය තුළින් ඔවුන් සමාජගත කිරීමත් තහවුරු වේ. 2019 වර්ෂය තුළ මෙම වැඩසටහන සඳහා රුපියල් මිලියන 28.6ක මූල්‍ය ප්‍රතිපාදන වැය කර ඇත.

තවද ජාතික ඒකාබද්ධතාවය හා ප්‍රතිසන්ධානය පිළිබඳ අංශය මඟින් භාෂාව ඉගෙනීම සම්බන්ධයෙන් පාසල් දරුවන් හා පාසල් දිරිමත් කිරීමේ අරමුණින් තෝරාගත් පාසල් කිහිපයක් වෙත මහජන ඇමතුම් පද්ධති ලබා දීමට කටයුතු සිදු කෙරිණි. 2019 වර්ෂයේ මෙම වැඩසටහන යටතේ මහජන ඇමතුම් පද්ධති පාසල් සහ දහම්පාසල් 94ක් සඳහා ලබා දී ඇත.



**සංස්කෘතික විවිධත්ව හුවමාරු වැඩසටහන්**

ජනතාව තුළ පවත්නා සංස්කෘතික විවිධත්වය හුවමාරු කර ගැනීම තුළින් ජාතික ඒකාබද්ධතාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ජාතික ඒකාබද්ධතාවය හා ප්‍රතිසන්ධානය පිළිබඳ අංශය මඟින් විවිධ සංස්කෘතික උත්සව සඳහා අනුග්‍රහය ලබා දේ. එහිදී තෛපොංගල් උත්සවය, නිදහස් දින උත්සව , අවුරුදු උත්සව , වෙසක්

උත්සවය, රාමසාන් උත්සවය හා නත්තල් යනාදී සියලු ජාතීන් සහභාගී කරගනිමින් පවත්වනු ලබන ආගමික හා සංස්කෘතික උත්සව සඳහා මූල්‍ය දායකත්වය ලබා දේ. 2019 වර්ෂයේදී දිවයින පුරා පැවති මෙවැනි වැඩසටහන් 46ක් සඳහා රුපියල් මිලියන 3.74ක මූල්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් වෙත ලබා දී ඇත.

**සංස්කෘතික ග්‍රන්ථ මුද්‍රණය කිරීම**

අන්‍ය භාෂාවන් හා සංස්කෘතීන් කෙරෙහි ගරු කිරීමට ජනතාව පෙළඹවීම සඳහා සිංහල භාෂාවෙන් රචනා කර ඇති ගම්පෙරළිය හා මඩොල්දූව නවකතා දෙමළ භාෂාවෙන්ද දෙමළ ජනකතා, දෙමළ රාමායනය යන ග්‍රන්ථ සිංහල භාෂාවෙන්ද මුද්‍රණය කර සිංහල/දෙමළ පාසල් ළමුන් සඳහා ලබා දීම හා සිංහල, දෙමළ ඇතුළු සියලු ජාතීන් එක අරමුණක් වෙනුවෙන් පෙනී සිටිය යුතු බව ප්‍රකාශිත දෙමළ බෞද්ධයා ග්‍රන්ථය මුද්‍රණය කිරීම මේ යටතේ සිදු විය. එසේම ජාතික ඒකතාබද්ධතාවයෙන් හා සහජීවනයෙන් යුක්ත රටක් උදෙසා ක්‍රියාත්මක වන වැඩසටහන් අතර බුද්ධ වන්දනා ග්‍රන්ථ බෙදා හැරීමද විශේෂ වැදගත්කමකින් යුක්ත වන අතර පොහෝ දින සිල්සමාදන් වන බැතිමතුන් සඳහා මෙම ග්‍රන්ථය ලබා දීම සිදු කරයි. 2019 වර්ෂයේදී මහනුවර ශ්‍රී දළදා මාලිගය, පිළියන්දල අශෝකාරාමය, වත්තල හැඳල පුරාණ විහාරය යනාදී ආගමික ස්ථාන වල සිල්සමාදන් වන උපාසක උපාසිකාවන්ට බුද්ධ වන්ධනා ග්‍රන්ථ ද අමාත්‍යාංශය මගින් සිදු කළ විවිධ වැඩසටහන්වලදී පාසල් සිසුන් හට ගම්පෙරළිය, මඩොල්දූව, දෙමළ ජනකතා, රාමායණය ග්‍රන්ථ ද ලබා දී ඇති අතර සංස්කෘතික ග්‍රන්ථ මුද්‍රණය කිරීම හා බෙදා හැරීම සඳහා රුපියල් මිලියන 9.86ක මූල්‍ය ප්‍රතිපාදන වැය කර ඇත.

**අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයේ දෙවන භාෂාව විෂය සඳහා විශිෂ්ට සාමාර්ථ ලැබූ සිසුන් ඇගයීම**

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ වූ ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය , ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව හා ඒකාබද්ධව සිදු කළ“දන්නවනම් උගන්වන්න දන්නැත්නම් ඉගෙනගන්න” ගුවන් විදුලි වැඩසටහන ශ්‍රවණය කර 2018 වර්ෂයේ අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයේ දෙවන භාෂා විෂය සඳහා විශිෂ්ට ප්‍රතිඵල ලබා ගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත ත්‍යාග පිරිනමන ලදී.



මෙම උත්සවය 2019.07.18 වන දින අරලියගහ මන්දිරයේදී ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මෙහිදී අ.පො.ස.සාමාන්‍ය පෙළ විභාගයේ දෙභාෂා විෂය සඳහා විශිෂ්ට ප්‍රතිඵල ලබා ගත් පාසල් ළමුන් 3130 ක් සඳහා පාසල් බෑග් සහ පොත් කට්ටල හා සිංහල මාධ්‍ය සිසුන් සඳහා දෙමල ජනකථා, රාමායණය ග්‍රන්ථද දෙමළ මාධ්‍ය සිසුන් සඳහා ගම්පෙරලිය හා මඩොල්දූව ග්‍රන්ථ ලබා දීම සිදු කරන ලද අතර එම පාසල්වල විදුහල්පතිවරුන්ට සහ ගුරුවරුන්ට සම්මාන හා ත්‍යාග ලබා දීමද සිදු කරන ලදී.

### 2.1.2 භාෂා අයිතිවාසිකම් අංශය.

**හැඳින්වීම**

ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයස්ථාපිත කරන ලද්දේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ඵලදායිව ක්‍රියාත්මක කිරීම සහ සහජීවනය වැඩි දියුණු කිරීමෙන්, ජාතික සමඟියෙන් යුතු සෑම පුරවැසියකුටම සම අවස්ථා සහිත සමාන පරිසරයක් ඇති කරලීම සඳහා වේ.

උක්ත අරමුණු සාක්ෂාත් කරනු වස් භාෂා අයිතිවාසිකම් අංශය මඟින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සහ සහජීවනය ගොඩනැංවීමට අදාළ විවිධ ප්‍රතිපත්ති සැලසුම් සම්පාදනය කිරීම, වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම, සේවා සැපයීම, පහසුකරණය සහ පසුවිපරම් යනාදි විවිධ කර්තව්‍යයන් සිදු කරනු ලැබේ.

**භාෂා අයිතිවාසිකම් අංශයේ අරමුණු**


- රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ සම්පාදනය කිරිම.
- රාජ්‍ය සේවය ද්වීභාෂාකරණය සඳහා අවශ්‍ය පසුබිම ගොඩ නැගීම.
- රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව මහජනතාව බල ගැන්වීම.
- භාෂා ප්‍රචාරණයට සහ ප්‍රවර්ධනයට අදාළව ශ්‍රී ලංකාවේ ජනයා අතර ධනාත්මක මානසිකත්වයක් උත්පාදනය කිරීම.

**භාෂා අයිතිවාසිකම් අංශයේ කාර්යයන්**

- රජයේ ආයතනවල භාෂා සැලසුම් සකස් කිරීමේ ක්‍රියාවලිය සඳහා දායක වීම.
- රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- අමාත්‍යාංශයේ විෂය පථයට අයත් විවිධ ජාතික සහ ජාත්‍යන්තර දින සැමරීම ආදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය ආයතනවල නාම පුවරු ත්‍රෛභාෂාවෙන් ස්ථාපිත කිරීම සඳහා පහසුකම් සැපයීම.
- රජයේ කාර්යාල සඳහා අත්‍යවශ්‍ය පෝරම ත්‍රෛභාෂාවට පරිවර්තනය කර මුද්‍රණය කිරීම සඳහා සහායවීම.
- රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි ලබා ගැනීම සහ ඒ සම්බන්ධයෙන් පියවර ගැනීම.

**ක්‍රියාකාරි සැලැස්මට අනුව කාර්ය සාධනය**

**භාෂා අයිතිවාසිකම් අංශය**




| *අනු අංකය* | *විස්තරය* | *ඇස්මේන්තුගත වියදම (රු.මිලි)* | *සත්‍ය වියදම (රු.මි)* | *ප්‍රතිශතය* |
|---|---|---|---|---|
| *1* | රාජ්‍ය ආයතනවල ත්‍රෛභාෂා නාම පුවරු ස්ථාපිත කිරීම | 2.45 | 2.546 | 104% |
| *2* | රාජ්‍ය ආයතනවල භාවිත වන පෝරම ත්‍රෛ භාෂාවට පරිවර්තනය කිරීම | 1.42 | 0.686 | 48% |
| *3* | දිවයින පුරා භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධ වැඩමුළු පැවැත්වීම | 5.07 | 4.90 | 97% |
| *4* | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාළ විශේෂ ව්‍යාපෘති | 2.00 | 2.00 | 100% |
| *5* | අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ජාතික හා ජාත්‍යාන්තර දින සැමරීම | 8.44 | 6.951 | 82% |
| *6* | 1956 භාෂා ඇමතුම් මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම. | 0.78 | 0.776 | 99% |
| *7* | කොළඹ කලාප අධ්‍යාපන කොට්ඨාසයට අයත් සිංහල පාසල්වල භාෂා අධ්‍යාපන පහසුකම් පිළිබඳ වැඩසටහන් | 0.539 | 0.539 | 100% |
| *8* | 2018 අ.පො.ස. සාපෙළ දෙවන භාෂාව (සිංහල/දෙමළ) විශිෂ්ය සාමාර්ථ ලබා ගත් සිසුන් ඇගයීමේ වැඩසටහන | 17.766 | 17.766 | 100% |
| *9* | භාෂා ප්‍රවර්ධන වැඩසටහන - උතුරු පළාත් මධ්‍යස්ථානය | 1.917 | 0 | 0% |
| *10* | භාෂා ප්‍රවර්ධන වැඩසටහන - උතුරු පළාත් මධ්‍යස්ථානය | 1.621 | 1.621 | 100% |
| | **එකතුව** | **42.00** | **21.79** | **92.29%** |

## 2.1.2 පාලන අංශය

**හැඳින්වීම**

අමාත්‍යාංශයේ යහපත් ආයතනික පරිපාලන පරිසරයක් පවත්වා ගෙනයාම, මානව හා භෞතික සම්පත් කළමනාකරණය කිරීම, කාර්ය මණ්ඩලයේ වෘත්තීය අවශ්‍යතා ඉටු කිරීම, අමාත්‍යාංශය යටතේ ඇති අනුබද්ධිත ආයතන සම්බන්ධීකරණය සහ අමාත්‍යාංශයේ සේවාවන් ක්‍රියාත්මක කිරීමට සහය වීම. පාලන අංශයේ ප්‍රධාන අරමුණු වේ.

**පාලන අංශයේ කාර්යයන්**

- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පරිපාලනය.
- අමාත්‍යාංශය යටතේ ඇති අනුබද්ධිත ආයතන සම්බන්ධීකරණය කිරීම.
- තනතුරු අනුමත කර ගැනීම.
- බඳවා ගැනීම් පටිපාටි සකස් කිරීම.
- පත් කිරීම්, මාරු කිරීම්, උසස් කිරීම් ආදී කටයුතු.
- පෞද්ගලික ලිපි ගොනු නඩත්තු කිරීම.
- විනය කටයුතු.
- පුහුණු කිරීම්.
- ගොඩනැඟිලි, වාහන ඇතුළු භෞතික සම්පත් නඩත්තු කිරීම.
- පාර්ලිමේන්තු උපදේශක කාරකසභා සම්බන්ධීකරණය.

අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම

## 2.1.3 සැලසුම් අංශය

**හැඳින්වීම**

සැලසුම් අංශය, ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන අංශවලින් එකකි. අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතන විසින් ක්‍රියාත්මක කළයුතු සංවර්ධන ව්‍යාපෘති / වැඩසටහන් හඳුනා ගැනීම සඳහා සහය වීම හා එම වැඩසටහන්වල කාර්යසාධනය ඇගයීම සිදු කරනු ලැබේ.ඒ අනුව මාසිකව, ත්‍රෛමාසිකව ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය සමාලෝචනය කර අපේක්ෂිත ඉලක්ක වලින් බැහැර වන අවස්ථා පිළිබඳව ඉහළ කළමනාකාරිත්වය වෙත වාර්තා ඉදිරිපත් කරනු ලැබේ.

**සැලසුම් අංශයේ කාර්යයන්**

- අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළියෙල කිරීම සඳහා අමාත්‍යාංශයේ අංශ සහ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සමඟ සම්බන්ධීකරණය.
- අමාත්‍යාංශය මගින් හඳුනා ගත් නියමු ව්‍යාපෘතිවලට අදාළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය.
- මාසික, ත්‍රෛමාසික සහ වාර්ෂික ප්‍රගති වාර්තා පිළියෙල කිරීම සහ ඒවා අමාත්‍යාංශයේ ලේකම් මඟින් ජනාධිපති කාර්යාලය,ජාතික අය-වැය දෙපාර්තමේන්තුව, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව,ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සහ උනන්දුවක් දක්වන අනෙකුත් පාර්ශවවලට ඉදිරිපත් කිරීම.
- පවත්නා වර්ෂයේ ප්‍රගතිය හා ඉදිරි වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කොට අයවැය සාකච්ඡාවන්හිදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.
- අමාත්‍යාංශයේ දත්ත සමුදාය පවත්වා ගෙන යාම, යාවත්කාලීන කිරීම සහ සංවර්ධනය කිරීම.

## 2.1.4 ගිණුම් අංශය

**හැඳින්වීම**

මෙම අංශය මගින් මූල්‍ය සේවා සැපයීමේ කටයුතු සම්බන්ධීකරණය සහ අදාළ අංශ සම්බන්ධීකරණය කිරීමෙන් අමාත්‍යාංශය සඳහා සාධනීය මූල්‍ය තොරතුරු සහ මූල්‍ය කළමනාකරණ පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබයි.

**ගිණුම් අංශයේ කාර්යයන්**

- ප්‍රධාන ගණන් තැබීමේ නිලධාරියා ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාට අමාත්‍යාංශයේ මූල්‍ය බැඳීම් ඉටු කරලීමට සහ පාර්ලිමේන්තුව වෙත වග වීම දැරීමට සහය වීම.
- රජයේ මූල්‍ය නීතිරීති සහ රෙගුලාසි සමඟ අනුකූලතාව සහතික කිරීම.
- මුදල් කළමනාකරණය ඇතුළුව, යහපත් මූල්‍ය ගිණුම්කරණ පද්ධතියක් ස්ථාපනය කිරීම සහ පවත්වා ගෙන යාම.
- මූල්‍ය වාර්තා සහ අයවැය අවශ්‍යතා පිළියෙල කිරීම / යාවත්කාලීන කිරීම /සමාලෝචනය කිරීම සහ ගිණුම් පියවීම සඳහා භාණ්ඩාගාරය, අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සහ විදේශ ආධාර ලබන ව්‍යාපෘති සමඟ සම්බන්ධීකරණය .
- මූල්‍ය සැලසුම්කරණය සහ අයවැයකරණය.
- කාලීන සහ නිවැරදි මූල්‍ය වාර්තාකරණය සහතික කිරීම.
- අමාත්‍යාංශ වත්කම් කළමනාකරණය .

## 2.1.5 අභ්‍යන්තර විගණන අංශය

**හැඳින්වීම**

අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින ආයතන වල සියලුම මට්ටම් වෙතින් ඉටු කෙරෙන සේවාවන් හා කාර්යයන් සමාලෝචනය, මැන බැලීම, ඇගයීම හා අභ්‍යන්තර පාලන ක්‍රමයේ සිද්ධිදායකභාවය සම්බන්ධයෙන් වාර්තා කිරීම මගින් කළමනාකරණයට සහයවීම මෙම අංශයේ අරමුණයි.

**අභ්‍යන්තර විගණන අංශයේ කාර්යයන්**

- වැරදි හා වංචා වැළැක්වීම සඳහා අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින ආයතන තුළ ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන ක්‍රමයේ සාර්ථකත්වය ඇගයීම හා අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට සහයවීම.
- ගිණුම් හා වෙනත් වාර්තා වල විශ්වාසනීයභාවය නිශ්චය කිරීම හා යොදාගෙන ඇති පිළිගත් ගිණුම්කරණපිළිවෙත් මගින් නිවැරදි මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේ දැයි සොයා බැලීම.
- කාර්ය මණ්ඩලයට පවරා ඇති වගකීම් ඉටුකිරීමෙහිලා ඔවුන්ගේ කාර්යසාධනයේ ගුණාත්මක භාවය ඇගයීම.
- අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින ආයතන වල වත්කම් සියලුම ආකාරයේ අලාභ හානි වලින් කොතරම් දුරට ආරක්ෂා වේ දැයි සොයා බැලීම.
- ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, රාජ්‍ය පරිපාලන, භාණ්ඩාගාර හා වෙනත් චක්‍රලේඛ හා උපදෙස් පිළිපදිනු ලැබේ දැයි සොයා බැලීම.
- අවශ්‍ය අවස්ථාවල දී විශේෂ විමර්ශන පැවැත්වීම.
- වැඩ, යෝජනා ක්‍රම හා ව්‍යාපෘති වල ප්‍රගතිය සහ ඒ පිළිබඳ වැඩසටහන් සහ කාලසටහන් කෙතෙක් දුරට ඉලක්කයන් සපුරා ගැනීම කෙරෙහි යොමු වී ඇත්දැයි ඇගයීම් කිරීම.
- කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් වරින් වර නිකුත් කරනු ලබනඋපදෙසහා මඟ පෙන්වීම් අනුව ක්‍රියාකිරීම,ඒඒ වර්ෂයේ සෑම කාර්තුවකටම වරක් අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සහ එම රැස්වීම්වලදි ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ පසුවිපරම් කිරීම.

## 2.1.6 සංහිඳියාව අරමුණු කරගත් ආර්ථික සවිබල ගැන්වීම හා සමාජ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය

**හැඳින්වීම**

ප්‍රතිසන්ධානය අරමුණු කරගත් ආර්ථික සවිබලගැන්වීම හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනව්‍යාපෘතිය අංක17/2020/705/006 හා 26.09.2017 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මත උතුරු හා නැගෙනහිර පළාත් සඳහා අනුමතව ක්‍රියාත්මක වූ අතර එමඟින් ආන්තීකරණයට ලක්වූ නාගරික/ග්‍රාමීය/ වතු අංශයන්හි ජනතාවගේ ජීවන තත්වය ඉහල නැංවීම සැලැකිල්ලට ගෙන මුළු දිවයිනට ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට 2018.08.10 දින යොමු කළ ව්‍යාපෘති යෝජනාව සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ගේ අනුමැතිය ලැබී ඇති ව්‍යාපෘතියකි. ඒ අනුව අඩු ආදායම්ලාභි පවුල් වල ජීවනෝපාය සංවර්ධනය කරමින්, ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමට අවශ්‍ය පරිසරය සකස් කරමින් සියලු ජන කොටස් වලට ප්‍රතිලාභ ලැබෙන සේ ජාතීන් අතර ඒකාබද්ධතාවය ඇති වන අයුරින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ .

වෙන් කරනු ලබන ප්‍රතිපාදනයන්ට යටත්ව සියලු ජන කොටස් වලට ප්‍රතිලාභ සැලසෙන අයුරින් ව්‍යාපෘති තෝරා ගැනීම, සැලසුම් කිරීම, ඇස්තමේන්තු කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය යන සෑම අවස්ථාවක දීම ග්‍රාමීය මට්ටමේ ප්‍රජා මූල සංවිධාන ( උදා :- සහජීවන සංගම්), ග්‍රාමීය, ප්‍රාදේශීය, දිස්ත්‍රික් නිලධාරින්ගේ හැකියාව ප්‍රායෝජනයට ගනිමින් දේශපාලන නායකත්වයෙ මඟ පෙන්වීම ඇතිව විනිවිද භාවයෙන් යුතුව වැඩසටහන ක්‍රියාත්මක වේ.

1. **යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති**

යටිතල පහසුකම් සංවර්ධනය යටතේ අමාත්‍යාංශය විසින් හඳුනාගත් ග්‍රාමීය මට්ටමේ ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය හිමිවන අතර එක් පවුලක් හෝ පවුල් කිහිපයක් එක්ව සකස් කර ගත නොහැකි පොදු අවශ්‍යතා හා මහා පරිමාණ සංවර්ධන වැඩසටහන්වලින් ආවරණය නොවන හදිසි ආපදා තත්ත්ව/ අවදානම් සහගත අවස්ථාවන්වලින් මිදීම සඳහා උපයෝගී වන යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ද අවධානය යොමු වේ.

**ආර්ථික සවිබල ගැන්වීම.**

ආර්ථික සවිබල ගැන්වීම යටතේ දරිද්‍රතාවයෙන් පීඩා විඳින හෝ ආන්තීකරණයට ලක්ව ඇති ග්‍රාමීය හා නාගරික අඩු ආදායම් ලාභී පවුල්වල ජීවනෝපාය සංවර්ධනය සඳහා පහසුකම් සැපයීමට අපේක්ෂිතය. මේ යටතේ දැනට කර ගෙන යන ස්වයං රැකියාවක් වැඩි දියුණු කර ගැනීමට හෝ අලුතින් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසන උපකරණ ලබාදීම සිදු කෙරේ.
උදා : මහන මැෂින්, කෘෂි කාර්මික උපකරණ , වතුර මෝටර්, රූපලාවන්‍ය උපකරණ, ආහාර පිසුම් කට්ටල ආදී......)

හඳුනාගන්නා ප්‍රතිලාභියා අඩු ආදායම්ලාභියකු බවට හා අදාළ කාර්යයේ නිරත වන බවට ග්‍රාම නිලධාරි නිර්දේශය සමඟ ප්‍රාදේශිය ලේකම් අනු අත්සන් කොට උපකරණ ඉල්ලුම් අයදුම්පත් දිස්ත්‍රික් ලේකම් මගින් යොමු කළ යුතුය.මයෙ හුදෙක් භාණ්ඩ බෙදා හැරීමක් නොවන අතර සැබෑ ලෙසම අදාළ කර්මාන්තයේ නියැලීමට දෙනු ලබන ආධාරයකි. ප්‍රතිලාභියා සමඟ ගිවිසුමකට එළැඹීමෙන් අනතුරුව භාණ්ඩ ප්‍රදානය කෙරේ.

**පවුල් තෝරා ගැනීමේ නිර්ණායක**

- දරිද්‍රතාවයෙන් පීඩා විඳින හෝ ආන්තීකරණයට ලක්ව ඇති ග්‍රාමීය හා නාගරික අඩු ආදායම් ලාභී පවුලක් වීම /කාන්තා මූලික පවුලක් වීම / ආබාධිත දරුවන් සිටින පවුලක් වීම
- අදාළ කාර්යයෙහි නිරතවීමට පුද්ගලයා කිසියම් පුහුණුවක් ලබා තිබීම හෝ

මේවන විටත් අදාළ කාර්යයෙහි නිරත වීම.

**ප්‍රතිපාදන පිළිබද මුදල් සීමා**

- තනි පවුලකට ලබා දිය හැකි ප්‍රදානයක උපරිම සීමාව රු 50000.00 ක් විය යුතුය.
- එම මුදල ඉක්මවන අවස්ථාවකදි එම මුදල දැරීමට ප්‍රතිලාභියා එකඟ නම් ඒ වෙනුවෙන් අවස්ථාව ලබා දීමට අවකාශ ඇත.

**සංවර්ධන වැඩසටහන්**

ආර්ථික දුෂ්කරතා හේතුවෙන් පීඩා විදින දරුවන් හා දුෂ්කර පාසල් තෝරාගෙන ඔවුන් බල ගැන්වීම වෙනුවෙන් වූ ව්‍යාපෘති මේ යටතේ හඳුනා ගැනේ.

- පාසැල් සඳහා ජල පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම්
- පොදු පහසුකම් සැපයීම ( ඩෙස් බංකු , ගොඩනැගිලි , ක්‍රීඩා පිටි සංවර්ධනය ආදී.)
- ඉගෙනුම් ආධාරක කට්ටල ලබාදීම. (පරිගණක පහසුකම්/ ස්මාර්ට් බෝඩ් ආදි..)
- පාසැල් වැට හා ගේට්ටු සකස් කිරීම

සංඛ්‍යා සටහන් අංක 2.1
සංහිදියාව අරමුණු කරගත් ආර්ථික සවිබලගැන්වීම හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනව්‍යාපෘතිය
(පළමු අදියර)

| *අනුඅංක* | *දිස්ත්‍රික්කය* | *අනුමත ප්‍රතිපාදන මුදල (රු.)* | *නිදහස්කළ ප්‍රතිපාදන මුදල (රු)* | *නැවත පවරා ගැනීම්* |
|---|---|---|---|---|
| 1 | කොළඹ | 273,349,570.32 | 264,926,684.97 | 208,468,885.45 |
| 2 | කළුතර | 16,225,832.35 | 16,225,832.35 | |
| 3 | කෑගල්ල | 20,297,534.09 | 20,297,481.70 | |
| 4 | නුවරඑළිය | 4,500,000.00 | 3,500,000.00 | |
| 5 | පුත්තලම | 1,830,149.19 | 1,830,149.19 | |
| 6 | අම්පාර | 20,108,325.15 | 20,108,325.15 | |
| 7 | යාපනය | 32,000,000.00 | 32,000,000.00 | |
| 8 | රත්නපුර | 6,974,105.98 | 6,974,105.98 | |
| 9 | ගම්පහ | 43,100,000.00 | 43,100,000.00 | |
| 10 | මාතර | 16,522,403.96 | 15,922,403.96 | |
| 11 | අනුරාධපුරය | 10,000,000.00 | 10,000,000.00 | |
| 12 | මහනුවර | 52,594,014.00 | 44,164,014.00 | |
| 13 | ගාල්ල | 3,208,850.00 | 3,208,850.00 | 2,670,000.00 |
| 14 | පොළොන්නරුව | 977,317.60 | 977,317.60 | |
| | **මුළු එකතුව** | **501,688,102.64** | **483,235,164.90** | **211,138,885.45** |

සංඛ්‍යා සටහන් අංක 2.2
සංහිඳියාව අරමුණු කරගත් ආර්ථික සවිබලගැන්වීම හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනව්‍යාපෘතිය
(දෙවන අදියර)

| *අනු අංක* | *දිස්ත්‍රික්කය* | *අනුමත ප්‍රතිපාදන මුදල (රු.)* | *නිදහස්කළ ප්‍රතිපාදන මුදල (රු)* | *නිදහස්කළ යුතු ප්‍රතිපාදන මුදල (රු)* |
|---|---|---|---|---|
| *1* | යාපනය | 75,582,089.78 | 66,082,089.78 | 9,500,000.00 |
| *2* | අම්පාර | 15,580,000.00 | 15,580,000.00 | |
| *3* | ත්‍රිකුණාමලය | 6,900,000.00 | 6,900,000.00 | |
| *4* | මඩකලපුව | 80,313,300.00 | 80,313,300.00 | - |
| *5* | මන්නාරම | 25,140,000.00 | 25,140,000.00 | - |
| *6* | මුලතිව් | 45,080,000.00 | 45,080,000.00 | - |
| *7* | වව්නියාව | 14,161,611.85 | 14,161,611.85 | - |
| *8* | කිලිනොච්චි | 1,000,000.00 | 1,000,000.00 | - |
| *9* | 2018 Liabilities | 40,000,000.00 | 40,000,000.00 | - |
| *10* | Admin | 1,500,000.00 | 660,992.96 | 839,007.04 |
| | **මුළු එකතුව** | **305,257,001.63** | **294,917,994.59** | **10,339,007.04** |

## 2.1.7 සංවර්ධන සහය ව්‍යාපෘති

### හැඳින්වීම

සංවර්ධන සහය ව්‍යාපෘතිය අංක19/2264/131/019 හා 18.09.2019 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ ජාතිය සමඟිය සහ ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලයට වෙන්කරන ලද ප්‍රතිපාදන වලින් ජාතික ඒකාබද්ධතා අංශයේ සහ රාජ්‍ය භාෂා අංශයේ සමාජ ප්‍රගති කටයුතු වෙනුවෙන් ප්‍රතිපාදන මාරුකිරීම සඳහා අනුමැතිය ලැබිණි. ඒ අනුව රුපියල් මිලියන 369.99 ප්‍රතිපාදන අමාත්‍යාංශයේ සමාජ ප්‍රගති විෂයය යටතට වෙන්වූ අතර එකී ප්‍රතිපාදන ඔස්සේ සංවර්ධන සහය ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

### යටිතල පහසුකම් සංවර්ධනය

යටිතල පහසුකම් සංවර්ධනය යටතේ ග්‍රාමීය මට්ටමේ ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය හිමිවන අතර එක් පවුලක් හෝ පවුල් කිහිපයක් එක්ව
සකස් කර ගත නොහැකි සියලු ජාතීන් වෙත සෙත සැලසෙන පොදු අවශ්‍යතා හා මහා පරිමාණ සංවර්ධන වැඩසටහන්වලින් ආවරණය නොවන හදිසි ආපදා තත්ත්ව/ අවදානම් සහගත අවස්ථාවන්වලින් මිදීම සඳහා උපයෝගී වන යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ද අවධානය යොමු වේ.

- ග්‍රාමීය/ වතු මාර්ග සංවර්ධනය
- ප්‍රජා ජල පහසුකම්
- පොදු නාන ස්ථාන/ සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය
- සේවා මධ්‍යස්ථාන (මාතෘ නිවාස/ සායන මධ්‍යස්ථාන)

- ළමා නිවාස සහ වැඩිහිටි නිවාස වැඩි දියුණු කිරීම සඳහා පහසුකම් ලබා දීම.

**ආර්ථික සවිබලගැන්වීම**

ආර්ථික සවිබලගැන්වීම යටතේ දරිද්‍රතාවයෙන් පීඩා විඳින හෝ ආන්තීකරණයට ලක්ව ඇති ග්‍රාමීය හා නාගරික අඩු ආදායම් ලාභී පවුල්වල ජීවනෝපාය සංවර්ධනය සඳහා පහසුකම් සැපයීමට අපේක්ෂිතය. මෙම වැඩසටහනෙහි අරමුණ වන්නේ, පවුල් ඒකකය තුළ වියදම් අඩු කර ගැනීමත්, අමතර ආදායම් ලබා ගැනීමේ සහ ප්‍රධාන ආදායම් මාර්ගයක් වශයෙන් ගෘහස්ථ මට්ටමින් කෘෂිකාර්මික, කාර්මික හෝ සේවා ක්ෂේත්‍රයන් තුළින් රැකියා අවස්ථා ඇතිකරලීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. ඒ අනුව, අඩු ආදායම් ලාභී පවුල් සඳහා පහත සඳහන් විෂයන් යටතේ දැනට කර ගෙන යන ස්වයං රැකියාවක් වැඩි දියුණු කර ගැනීමට හෝ අලුතින් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සිදු කෙරේ.

1. කෘෂිකාර්මික කටයුතු
2. ස්වයං රැකියා ( ආහාරපාන ආශ්‍රිත නිෂ්පාදන, ඇඳුම් මැසීම, ආදී...)
3. හස්ත කර්මාන්ත
4. වඩු කර්මාන්තය
5. සත්ත්ව පාලනය
6. ධීවර කර්මාන්තය ආශ්‍රිත කටයුතු
7. කාර්මික කටයුතු
8. ජංගම වෙළඳ කටයුතු සඳහා පහසුකම් සැපයීම

**සමාජ ප්‍රගමනය පිණිස අධ්‍යාපනික සංවර්ධනය**

ආර්ථික දුෂ්කරතා හේතුවෙන් පීඩා විඳින දරුවන් හා දුෂ්කර පාසල් තෝරාගෙන සමාජ ප්‍රගමනය පිණිස ඔවුන් බල ගැන්වීම වෙනුවෙන් වූ ව්‍යාපෘති මේ යටතේ හඳුනා ගැනේ.

- පාසැල් සඳහා ජල පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම්
- පොදු පහසුකම් සැපයීම

( ඩෙස් බංකු , ගොඩනැගිලි , ක්‍රීඩා පිටි සංවර්ධනය ආදී.....)

- ඉගෙනුම් ආධාරක කට්ටල ලබාදීම ( පරිගණක පහසුකම්/ ස්මාර්ට් බෝඩ් ආදි....)
- පාසැල් වැට හා ගේට්ටු සකස් කිරීම
- ප්‍රවාහන දුෂ්කරතා සහිත පාසල් දරුවන් සඳහා බයිසිකල් ලබාදීම.

සංඛ්‍යා සටහන් අංක 2.3
සංවර්ධන සහය ව්‍යාපෘති -2019

| *අනුඅංක* | *දිස්ත්‍රික්කය* | *අනුමත ප්‍රතිපාදන මුදල (රු.)* | *නිදහස්කළ ප්‍රතිපාදන මුදල (රු)* | *නැවතපවරාගැනීම්* |
|---|---|---|---|---|
| *1* | මුලතිව් | 24,530,000.00 | 12,830,000.00 | |
| *2* | මොණරාගල | 15,496,009.98 | 15,496,009.98 | |
| *3* | කිලිනොච්චි | 46,550,000.00 | 22,550,000.00 | |
| *4* | යාපනය | 92,338,145.30 | 24,344,970.00 | |
| *5* | මන්නාරම | 68,654,000.00 | 62,629,000.00 | |
| *6* | කොළඹ | 262,282,857.23 | 21,257,206.11 | 65,617,504.95 |
| *7* | මහනුවර | 10,347,000.00 | 9,047,000.00 | |
| *8* | කෑගල්ල | 4,612,417.47 | 3,612,417.47 | |
| *9* | අම්පාර | 14,907,000.00 | 14,907,000.00 | |
| *10* | කුරුණෑගල | 1,458,294.00 | 1,458,294.00 | |
| *11* | බදුල්ල | 6,600,000.00 | - | |

| | | | | |
|---|---|---|---|---|
| *12* | මඩකලපුව | 35,550,000.00 | 35,550,000.00 | |
| *13* | නුවරඑළිය | 30,564,076.10 | 6,464,076.10 | |
| *14* | පුත්තලම | 983,550.96 | - | |
| *15* | රත්නපුර | 3,545,837.93 | 3,545,837.93 | |
| *16* | ගම්පහ | 3,799,631.70 | 2,599,631.70 | |
| *17* | මාතලේ | 1,500,000.00 | | |
| *18* | ගාල්ල | 700,000.00 | | |
| | **Total** | **624,418,820.67** | **236,291,443.29** | **65,617,504.95** |

## 2.1.8 දිස්ත්‍රික් සංහිඳියා කමිටු

**හැඳින්වීම**

තිස්වසරක යුද්ධය හේතුවෙන් ඇති වූ ආර්ථික පීඩාවන් මෙන්ම ජාති, ආගමික, කලාපීය අන්තවාදී ක්‍රියාවන් ඉතා අඩු මට්ටමින් හුදකලාව ඉටුවෙමින් අන්තවාදය පෝෂණය වන බවට පෙනී ගිය නිසා එම තත්වය මැඩලීම පිණිස ජාතික ඒකාබද්ධතාවය, ප්‍රතිසන්ධානය, සහජීවනය හා තිරසර සාමය ඇති කරලීමේ මනා යාන්ත්‍රණයක් මඟින් මෙම ගැටළු නිරාකරණය කිරීම පිණිස සංහිඳියා කමිටු ඇතිකර ඇත.

**කමිටුවේ සංයුතිය**

1. දිස්ත්‍රික් ලේකම් (කැඳවුම්කරු)
2. අන්තර් ආගම් නායකයන් (බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු සහ ඉස්ලාම් ආගම්)
3. පොලිස් අධිකාරි
4. තෝරාගත් නිලධාරීන් හා නිරීක්ෂකයන් වශයෙන් වෙනත් අය (විශ්‍රාම ලත් නඩුකාරවරාන්, විදුහල්පතිවරුන්යනාදී අය)

**අරමුණු**

දිස්ත්‍රික් මට්ටමේ ප්‍රතිසන්ධාන කමිටුවේ අරමුණු පහත පරිදි වේ.

1. ප්‍රදේශයේ ආගමික හා ජනවාර්ගිත ගැටුම්වල හේතු හා පසුබිම් අධ්‍යනය කිරීම සහ එම ගැටළුවට මැදිහත් වීමේ සුදුසු උපක්‍රමයක් හා එළැඹුමක් සැකසීම.
2. ආගමික ස්ථානවලට සිදුවෙන ප්‍රහාරයන් හේතුවෙන් ඇතිවෙන ආතතිය පරීක්ෂා කර එම ගැටුම නිරාකරණය කිරීමට ඉක්මන් ප්‍රතිචාර ලබාදීම.
3. ආගමික හා ජනවාර්ගික ගැටුමෙහි මූල හේතුව පරීක්ෂා කිරීම හා ගැටුම් ඇතිකරනවුන් හා වින්දිතයන් ඇතුළුව ඒ සඳහා වගකිව යුතු පාර්ශවයන් හට ගැටුම් නිරාකරණ එළඹුම තුළින් මේ සඳහා මැදිහත් වන ලෙසට ඇරයුම් කිරීම.
4. ආතතීන් හා සිද්ධීන් වඩා තුලිත දෘෂ්ටි කෝණයකින් සමාලෝචනය කිරීම හා සමඟියෙන් ගැටළු විසඳා ගැනීම සඳහා කණ්ඩායම් අතර සාකච්ඡා ඇති කිරීම.
5. දිස්ත්‍රික් කාර්යාලයේ සහය සහිතව ආතතීන් හා ආගමික හා ජාතිභේදවාදී සිද්ධීන් සම්බන්ධ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.
6. ප්‍රාදේශීය සන්දර්භයන්ගේ ප්‍රාන ස්ථරයන් හඳුනාගෙන අවශ්‍ය තන්හිදී ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කිරීම හා සුදුසු ක්‍රමවේද හා එළඹුම් තුළින් ගැටුම් නිරාකරණය හා මැදිහත්වීම හා සාකච්ඡා කිරීම.
7. කණ්ඩායම් විසින් ගැටළු හෝ ගැටුම් ඇති කරන වාචික ප්‍රහාරයන් හෝ වෛරී භාෂා භාවිතය සම්බන්ධවද කටයුතු කළ යුතුය.

## 2.1.9 අතුරුදහන් වීම පිළිබඳ සහතිකය ලද ග්‍රාහකයන් සඳහා රු 6000.00 ක අතුරු සහනාධාරයක් ප්‍රදානය කිරීම

**හැඳින්වීම**

ශ්‍රී ලංකා රජය විසින් භාරගන්නා ලද කාර්යයන් කඩිනම් කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින්, සිවිල් යුද්ධයෙන් හා ගැටුම් නිසා පීඩාවට පත් වූ පුරවැසියන්ට සහන සැලසීම තුළින් තිරසාර සාමය ළඟා කරගැනීම සඳහාත් සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම සඳහාත් 2019 අයවැයෙන් රුපියල් බිලියන 15.25 ක මූල්‍ය ප්‍රතිපාදන සලසා ඇත.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් නිර්දේශ කර ඇති පරිදි ක්‍රියාන්විතයේ දී අතුරුදහන් වූ ආරක්ෂක අංශවල නිලධාරීන්ගේ සහ පොලිස් නිලධාරීන්ගේ පවුල් ද ඇතුළත් අතුරුදහන් වීම පිළිබඳ සහතික ලද අතුරුදහන් වූවන්ගේ පවුල්වලට අතුරු සහනාධාරයක් ලබා දීමේ වැඩ පිළිවෙලක් ලෙස මසකට රු.6000/= ක දීමනාවක් ලබා දීම මෙයට ඇතුළත්ව ඇත.

මෑතක දී ස්ථාපනය කරන ලද හානි පූරණය සඳහා වන කාර්යාලය අගතියට පත් පුද්ගලයන්ට වන්දි ලබාදීම සඳහා පහසුකම් සැලසීමේ සිය කාර්යයන් ආරම්භ කරන තෙක්ම මෙම ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට යෝජනා වී ඇත.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් 2018 වර්ෂයේ අගෝස්තු මස ප්‍රකාශයට පත්කරන ලද එහි අතුරු වාර්තාවේ මෙකී නිර්දේශ එම කාර්යාලය විසින් යෝජනා කර ඇති අතර එම නිර්දේශ 2019 වර්ෂයේ අයවැය වාර්ථාවට ඇතුළත් කරනු ලදුව එයට පාර්ලිමේන්තු අනුමැතිය ද හිමි වී ඇත.අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වල සාමාජිකයන් මුහුණ දෙන ආර්ථික අපහසුතා හඳුනාගෙන හානි පූරණය සඳහා වන කාර්යාලය (2018 අංක 34 පනත යටතේ ස්ථාපිත කරන ලද) විසින් සලසන පහසුකම් හරහා වන්දි හා වෙනත් අන්දමේ හානි පූර්ණ ලබා දෙන තෙක්ම මෙම පවුල් අතරින් වඩාත් අවදානම් සහගත පවුල්වලට අතුරු සහනාධාරයක් ලබාදීමේ වැදගත්කම අවබෝධ කරගනිමින් ඔවුන්ගේ සංකීර්ණ අවශ්‍යතාවන් සපුරා ගැනීමට සහාය වීම සහ ඔවුන් ලද පීඩාවන් පිළිබඳ සිය සංවේදී බව එත්තු ගැන්වීම යන කරුණු සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් මෙම නිර්දේශ ඉදිරිපත් කර ඇත.

ඒ අනුව මේ වන විට දක්නට නොමැති සහතිකය හිමි 153 දෙනෙකු වෙනුවෙන් මෙම මාසික දීමනාව ගෙවනු ලබන අතර මරණ සහතිකය පදනම්ව ද ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බැවින් ඉල්ලුම්පත් ප්‍රමාණය 22000 ක් පමණ විය හැකි බවට ගණන් බලා තිබේ. අතුරුදහන් වීම් පිළිබඳ සහතිකපත්ලාභීන් රුපියල් 6000ක මාසික දීමනාව ලැබීමට සුදුස්සෝ වෙති.

සංඛ්‍යා සටහන් අංක 2.4

අතුරුදහන් වීම පිළිබඳ සහතිකය ලද ග්‍රාහකයන් සඳහාරු 6000.00 ක අතුරු සහනාධාරය - 2019

(ජනවාරි- ඔක්තෝම්බර්)

| *අනු අංකය* | *ප්‍රාදේශීය ලේකම් කාර්යාලය* | *ප්‍රතිලාභීන් සංඛ්‍යාව* | *නිදහස්කළ ප්‍රතිපාදන මුදල (රු)* |
|---|---|---|---|
| *1* | කරවඩ්ඩි | 1 | 60,000.00 |
| *2* | කරෙයිනගර් | 8 | 332,277.42 |
| *3* | කෝප්පායි | 6 | 360,000.00 |
| *4* | නල්ලූර් | 2 | 85,600.00 |
| *5* | පොසින්ට් පෙඩ්රු | 14 | 761,400.00 |
| *6* | වඩමාරච්චි නැගෙනහිර | 1 | 50,800.00 |
| *7* | වඩමාරච්චි බටහිර (පොයින්ට් පෙඩ්රො) | 1 | 60,000.00 |
| *8* | වෙලානායි | 2 | 104,600.00 |
| *9* | චාවකච්චේරි | 2 | 84,703.23 |
| *10* | කේයිට්ස් | 2 | 93,800.00 |
| *11* | කෝරලෙයිපත්තු (වාලච්චේනෙයි) | 30 | 1,466,400.00 |
| *12* | කෝරලෙයිපත්තු මධ්‍යම (වාලච්චේනෙයි) | 6 | 329,400.00 |
| *13* | මන්මුනායි උතුර | 6 | 346,000.00 |
| *14* | මන්මුනායි බටහිර (වවුනතිව්) | 34 | 1,541,400.00 |
| *15* | මන්මුනායිපත්තු | 7 | 376,600.00 |
| *16* | පෝරතිව්පත්තු (වෙල්ලවේලි) | 29 | 1,388,400.00 |
| *17* | කෝරලෙයිපත්තුඋතුර (වාකරෙයි) | 2 | 120,000.00 |
| | මුළු එකතුව | 153 | 7,561,380.65 |

උක්ත සංඛ්‍යා සටහන් අංක 10.1 අනුව 2019 වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝම්බර් දක්වා අතුරුදහන් වීම පිළිබඳ සහතිකය ලද ග්‍රාහකයන් සඳහාරු 6000.00 ක අතුරු සහනාධාරය හිමි ප්‍රතිලාභීන් 153 දෙනෙකු සඳහා රුපියල් 7,561,380.65ක ප්‍රතිපාදන මුදලක් ගෙවීමට කටයුතු කළ අතර නොවැම්බර් සිට දෙසැම්බර් දක්වා රුපියල් 8,434,801.65ක මුදලක ප්‍රතිපාදන නිදහස් කරන ලදී.

# 2.2අමාත්‍යාංශයට අයත් ආයතනයන්හි කාර්යසාධනය 2019

### 2.2.1 රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

**හැඳින්වීම**

1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස 1956.10.01 දින රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී.1987 - 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ 1988-16 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව සිංහල හා දෙමළ භාෂා දෙකම ශ්‍රි ලංකාවේ රාජ්‍ය භාෂා ලෙසත්, ඉංග්‍රීසි සන්ධාන භාෂාව ලෙසත් නම් කෙරිණි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ 18 හා 19 වන ව්‍යවස්ථාවල සඳහන් වන පරිදි රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සලසන්නා ලෙස ඉහත සඳහන් භාෂා තුනට අදාළ පරිවර්තන කටයුතු රජයට සපයාදීමත්, රාජ්‍ය සේවකයන්ගේ භාෂා නිපුණතා වැඩිදියුණු කිරීමත්, පාරිභාෂික ශබ්දමාලා සකස් කිරීමත්, භාෂා පෙළ පොත් සහ ශබ්ද කෝෂ සම්පාදනය කිරීමත් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබයි.අංක 341/7, කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයේ පිහිටා ඇති මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තනතුර රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් විසින් හොබවනු ලබයි.

*දැක්ම*

සහජීවනයෙන් පිරිපුන් සාමකාමී ත්‍රෛභාෂික සමාජයක්

*මෙහෙවර*

ජනවාර්ගික සමගිය හා සාමය අරමුණු කරගත් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය කාර්යක්ෂමව ක්‍රියාවට නැංවීම සඳහා පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය

**දෙපාර්තමේන්තුව මඟින් ඉටුකරනු ලබන ප්‍රධානකාර්යයන්**

1. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගැනීමට නියමිත නිලධාරින් සඳහා අදාළ ලිඛිත හා වාචික පරීක්ෂණ පැවැත්වීම හා සහතිකපත් නිකුත් කිරීම.
2. රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල පරිවර්තන කාර්යයන් ඉටුකිරීම.(සිංහල, දෙමළ,ඉංග්‍රිසි )
3. විවිධ විෂයයන් සඳහා සිංහල, දෙමළ,ඉංග්‍රීසි පාරිභාෂික පදමාලා සම්පාදනය කිරිම.
4. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීම සඳහා වන පෙළ පොත්, ආධාරක ග්‍රන්ථ හා සංයුක්ත තැටි සම්පාදනය කිරීම හා අලෙවි කිරීම.
5. නවීන තාක්ෂණික ක්‍රම උපයෝගී කරගනිමින් සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මෙන්ම විදේශ භාෂා ඉගැන්වීම හා විභාග පැවැත්වීම.
6. බාහිර ආයතනවල කාර්ය මණ්ඩල සඳහා භාෂා ප්‍රවීණතා විභාග හා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම
7. විශ්වවිද්‍යාල හා පිළිගත් අධ්‍යාපනික ආයතනවල භාෂා පරිවර්තන පාඨමාලා හදාරන්නන්ට ප්‍රායෝගික පුහුණුව ලබාදීම.

ඉහත සඳහන් සියලු කාර්යයන් ඉටුකිරීම සඳහා දෙපාර්තමේන්තුව තුළ සංවර්ධන, ගිණුම් , පාලන ,විභාග, භාෂා පරිවර්තන, භාෂා විද්‍යාගාරය, භාෂා පර්යේෂණ සහ ග්‍රන්ථ සම්පාදන, පදමාලා සම්පාදන, පුස්තකාලයන අංශ ස්ථාපනය කොට ඇත.

### 2.2.2 රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

**හැඳින්වීම**

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව 1991 අංක 18 දරණ රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනත මඟින් ස්ථාපිත ව්‍යස්ථාපිත මණ්ඩලයකි. කොමිෂන් සභාව අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන සමාජිකයන් 06

දෙනෙකුගෙන් සමන්විත වේ.සභාපතිවරයා වශයෙන් මෙයින් එක් සමාජිකයෙකු ජනාධිපතිතුමා විසින් නම් කරනු ලබයි.රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ කොමසාරිස් නිල බලයෙන් කොමිෂන් සභාවේ ලේකම්වරයා ද වේ.

**දැක්ම**

මහජනයා වෙත සේවා සපයන සියලු ආයතනවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා බලාත්මක වූ ආයතනය වීම.

**මෙහෙවර**

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් විමර්ශනය , අධීක්ෂණය, අධ්‍යාපනය හා උපදේශනය තුළින් මහජනතාවගේ ද්වි භාෂා අවශ්‍යතා සැපයීම.

**අරමුණු**

- රාජ්‍ය භාෂා භාවිතය පිළිබඳ ප්‍රතිපත්තිමය මූලධර්ම නිර්දේශ කිරීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ iv වන පරිච්ජේදයේ අන්තර්ගත විධිවිධාන අනුව ක්‍රියා කිරීම පිළිබඳව විමසිලිමත්වීම හා අධීක්ෂණය කිරීම .
- මෙහි මින්මතු "අදාළ භාෂාව" යනුවෙන් සඳහන් කරනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන ව්‍යවස්ථාවෙහි සඳහන් භාෂා භාවිතය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ iv වන පරිච්ජේදයේ භාවාර්ථයට හා චේතනාවට අනුකූලව සිදුවන බවට වගබලා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ක්‍රියාවන් කිරීම සහ පියවර ගැනීම .
- රාජ්‍ය භාෂා ඇගයීම දිරිගැන්වීම සහ ඒවායේ තරාතිරම, සමානත්වය සහ භාවිතා කිරීමේ අයිතිවාසිකම පිළිගැනීම, පවත්වාගෙන යාම සහ ඉදිරියට ගෙන යාම.
- සිය මෙහෙයවීමෙන් සහ ලැබෙන යම් පැමිණිලි වලට ප්‍රතිචාර වශයෙන් යන දෙයාකාරයෙන්ම විමර්ශන පැවැත්වීම හා මේ පනතේ විධිවිධාන වලින් සලසා ඇති පරිදි ප්‍රතිකර්ම යෙදීම.

**රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ කාර්යයන්**

- අදාළ භාෂාවලින් යම් භාෂාවක තරාතිරම හෝ භාවිතය කෙරෙහි බලපාන්නා වූ හෝ බලපෑ හැකි යම් නියෝග , විධාන හෝ පරිපාලන පරිචය සම්බන්ධයෙන් සමාලෝචන මූලාරම්භ කිරීම.
- අදාළ භාෂාවල තරාතිරම හෝ භාවිතය සම්බන්ධයෙන් අවශ්‍ය යැයි හෝ යෝගය යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලැබිය හැකි අධ්‍යයන හෝ ප්‍රතිපත්ති ප්‍රකාශන නිකුත් කිරීම හෝ යොදා ගැනීම.
- අදාළ භාෂාවල තරාතිරම හෝ භාවිතය සම්බන්ධයෙන් යෝග්‍ය යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලැබිය හැකි ප්‍රකාශනවලට හෝ වෙනත් ජනමාධ්‍ය නිරූපණ වලට අනුග්‍රහය දීම හෝ ඒවා ආරම්භ කිරීම ඇතුළුව පොදු අධ්‍යාපනික ක්‍රියාකාරකම්වල නිරතවීම.
- යම් චංචල හෝ නිශ්චල දේපළ මිලදී ගැනීමෙන් හෝ අන්‍යාකාරයෙන් අත්කර ගැනීම සහ දැරීම , බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, මඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.
- කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය හෝ අනුෂංගික නැතහොත් කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ අනුෂාංගික වෙනත් සියලු දේ කිරීම.

### 2.2.3 ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය හා එහි ප්‍රගතිය

**හැඳින්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ත්‍රෛභාෂා සංකල්පය ක්‍රියාවට නැංවීමේ අරමුණින් ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් 2007 අංක 26දරණ ජාතික භාෂා අධ්‍යාපන හා

පුහුණු ආයතන පනත අනුව ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය ප්‍රතිෂ්ඨාපනය කර ඇත.

ආරම්භයේදී එනම් 2007නොවැම්බර් මස පළමුවැනි දින සිට මෙම ආයතනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැණුනු අතර ආයතනය එම අමාත්‍යාංශය පිහිටි කොළඹ 03, ගාලු පාරේ අංක 310 යන ස්ථානයේ පවත්වාගෙන යන ලදී. 2010 අප්‍රේල් මස 25 වැනි දින සිට අමාත්‍යාංශය ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය වශයෙන් නාම ගත කරන ලද අතර ,මෙම ආයතනය එම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන අතරට එක් විය.

2011 නොවැම්බර් 15 දින සිට ආයතනයේ ප්‍රධාන කාර්යාලය අංක 155/ඒ, කාසල් වීදිය, කොළඹ 08 යන ස්ථානයේ පවත්වාගෙන ගිය අතර 2013 සැප්තැම්බර් මස 03 වෙනි දින සිට 2015 පෙබරවාරි 28 දින දක්වා දෙවන මහළ, ගොඩනැගිලි අංක 09, බණ්ඩාරණායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 07 යන ස්ථානයේ ද, 2017 මැයි 30 දින දක්වා අංක 40, බුත්ගමුව පාර, රාජගිරිය යන ලද අතර වර්තමාන වන විට අංක 321/1, හයිලෙවල් පාර, මාකුඹුර යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබයි. මේ වන විට ආයතනය තම අරමුණු ඉටුකර ගැනීම සඳහා විශේෂ වැඩසටහන් හා පුහුණු පාඨමාලා දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරමින් පවතී .ඒවා අතරින් පහත සඳහන් වැඩසටහන් ප්‍රධාන වේ.

- සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහන් වලට අදාල විෂය නිර්දේශ පිළියෙල කිරීම.
- සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා පුහුණු කරුවන් පුහුණු කිරීම.
- දෙවන භාෂාව ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සහ දෙවන භාෂාව ඉගැන්වීම පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාව ක්‍රියාත්මක කිරීම.
- ගුරු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සම්පත් දායකයින් සඳහා පසු විපරම් සහ නියාමන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- භාෂා පරිවර්තනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා / ඩිප්ලෝමා පාඨමාලා ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය නිලධාරින් සඳහා අර්ධ කාලීන දෙවන භාෂා පුහුණු පාඨමාලා (I මට්ටම, II මට්ටම, III මට්ටම සහ IV මට්ටම)ක්‍රියාත්මක කිරීම
- රාජ්‍ය නිලධාරීන් සහ අ.පො.ස (උ.පෙළ) නිම කළ සිසුන් සඳහා දින 12 නේවාසික / නේවාසික නොවන කෙටි කාලීන භාෂා පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම.
- ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම.
- අලුතින් බඳවා ගන්නා ලද නිලධාරීන් සඳහා සිමාවාසික කාලය තුළ දී කෙටිකාලීන දෙවන භාෂා පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම. (වෛද්‍යවරුන්, ඉංජිනේරු වෘත්තිකයන් සහ අනෙකුත් වෘත්තිකයන් සඳහා)
- ගුවන් විදුලි නාලිකා හරහා භාෂා පුහුණු වැඩසටහන් ප්‍රචාරණය කිරීම.
- අ.පො.ස (සා.පෙළ) දෙවන භාෂා විෂය සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම.

ආයතනය මඟින් සංවිධානය කරනු ලබන නේවාසික පාඨමාලා රාශියක් ගලේවත්ත , අගලවත්ත පිහිටි පුහුණු මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක කරනු ලැබේ .රමණීය භූමි භාගයක පිහිටි මෙම පුහුණු ආයතනය පුහුණුවන්නන් 250ට පමණ එකවර සහභාගිවිය හැකි දේශන ශාලාවකින් ද, 30 දෙනෙකු සහභාගී විය හැකි භාෂා විද්‍යාගාරයකින් ද, 60 දෙනෙකුට නවාතැන් පහසුකම් සැපයිය හැකි නේවාසිකාගාරයකින් හා පුස්තකාලයකින් ද සමන්විත වේ.

ඉහතින් සඳහන් කරන ලද පාඨමාලා දිපව්‍යාප්ව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රවීණ සම්පත්දායක මණ්ඩලයක දායකත්වය ලබාගන්නා අතර ආයතනයේ කාර්ය මණ්ඩලයද ඒ සඳහා ඉමහත් කැපවීමකින් යුතුව කටයුතු කරනු ලබයි.

**දැක්ම**

ජාතික භාෂා පුහුණුව තුළින් ශ්‍රී ලාංකේය ජනතාව අතර සාමය සහ සහජීවනය වර්ධනය කිරීම.

**මෙහෙවර**

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස භාෂා අධ්‍යාපන සහ පුහුණුව සඳහා තෙ භාෂා දැනුම් සම්පාදන කේන්ද්‍රස්ථානය ලෙසින් කටයුතු කිරීම .

**අරමුණු**

- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාපිළිබඳ දැනුම ලබා ගැනීමට කැමැත්තෙන් සිටින්නේ යම් තැනැත්තෙක් ද එවැනි තැනැත්තන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමට දක්ෂ ගුරුවරුන් බිහි කිරීම.
- ලිඛිත නීතියකින් පිහිටුවන ලද ජාතික භාෂා පරිවර්තක සේවයෙන් පත් කළ යුතු සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවල නිපුණතාවයන් ඇති පරිවර්තකයින් සහ භාෂණ පරිවර්තකයින් බිහිකිරීම.
- සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා වලින් භාෂා ගුරුවරුන්, භාෂා පරිවර්තනයින් සහ භාෂණ පරිවර්තකයින් පුහුණු කිරීමට සුදුසුකම් ලත් ගුරුවරුන් බිහි කිරීම.
- මහජනතාවට කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා ත්‍රෛභාෂා හැකියාවැති තැනැත්තන් පුහුණු කිරීම

**ආයතනයේ කාර්යය භාරය**

- සිංහල ,දෙමළ සහ ඉංග්‍රීසි භාෂා දැනුම ලබා ගැනීමට අපේක්ෂා කරන තැනැත්තන් හට සිංහල ,දෙමළ සහ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමට දක්ෂ තැනැත්තන් බිහි කිරීම සඳහා සිංහල , දෙමළ ,ඉංග්‍රීසි භාෂා පිළිබඳ දීර්ඝ පුහුණුවක් ලබා දීම.
- ආයතනයේ ක්‍රියාකාරීත්වය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා පර්යේෂණ සහ අධ්‍යයනවල ප්‍රතිඵල භාවිතා කිරීමේ අරමුණු ඇතිව භාෂා පුහුණු කිරීමට අදාළව පවතින ගැටලු පිළිබඳ පර්යේෂණ සහ අධ්‍යයන පැවැත්වීම.
- සුදුසු තැනැත්තන් හට භාෂා පුහුණුව සහ අධ්‍යාපනය ලබා දීම සහ ඒ පුහුණුවීම සහ අධ්‍යාපනය සම්පූර්ණ කරන සාර්ථක අපේක්ෂකයන්ට සහතික පත් සහ ඩිප්ලෝමා ප්‍රදානය කිරීම.
- භාෂා ඉගැන්වීම කරගෙන යාමට පුහුණු පුද්ගලයන්ගෙන් සමන්විත මණ්ඩලයක් පිහිටුවීම.
- භාෂාවන්ට අදාළ කාරණා පිළිබඳ තොරතුරු තැන්පත් කර තබන ස්ථානයක් පිහිටුවීම.
- භාෂා පරිවර්තකයින් ,භාෂණ පරිවර්තනයින් සහ ලඝුලේඛකයින් යනාදි වශයෙන් විශේෂ කාණ්ඩවලට අයත් තැනැත්තන් සඳහා සිංහල , දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් විශේෂිත භාෂා පුහුණු පාඨමාලා පැවැත්වීම.
- අවශ්‍ය යැයි පෙනි යන අවස්ථාවලදී සිංහල ,දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවල තත්ත්වය වැඩි දියුණු කිරීම සහ ඒවාට කළ යුතු වෙනස්කම් පිළිබඳ අදාල අධිකාරියට නිර්දේශ ඉදිරිපත් කිරීම , සිංහල ,දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා සහ විදේශීය භාෂා පිළිබඳ භාෂාමය පර්යේෂණ කටයුතු කර ගෙන යාම , ඒවාට සහය දැක්වීම සහ ප්‍රවර්ධනය කිරීම.

ආයතනයෙහි ඉහතින් සඳහන් කරන ලද පරමාර්ථයන් ඉටු කර ගැනීම සඳහා අදාළ සියලු තීරණයන් කළමනාකරණ මණ්ඩලය විසින් ගනු ලබන අතර ආයතනයේ අධ්‍යයන කටයුතු වලට අධ්‍යයන මණ්ඩලය විවිධ අයුරින් සහය දක්වයි .උපදේශක

සභාව මගින් ආයතනයේ වර්ධනය උදෙසා ගනු ලබන පියවරවල් වල ඵලදායකත්වය පිළබඳ ආයතනයට උපදෙස් ලබා දීමත් ආයතනයට අදාල ගැටළු සහ ආයතනයේ සංවර්ධනය පිළිබඳව සාකච්ඡා කිරීමට සාකච්ඡා මණ්ඩලයක් සලසා දීමත් සිදු කරයි.

## 2.2.4 රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

**හැඳින්වීම**

රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය 1996 වසරේදී සෞඛ්‍ය මහමාර්ග සහ සමාජ සේවා අමාත්‍යාංශයෙහි පිහිටුවන ලද අතර පසුව මෙය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පැවැතිණි.අංක 1933/13 හා 2015/09/21 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය අනුවජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය යටතට පත්කෙරුනු අතර වර්තමානයේ දී මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

මෙම ලේකම් කාර්යාලය මගින් 1980 අංක 31 දරන ස්වෙච්ඡා සමාජ සේවා සංවිධාන ලියාපදිංචිය සහ අධීක්ෂණ පනත හා 2016 අංක 06 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි.

**පරමාර්ථ**

- ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන පනත හා ක්ෂුද්‍ර මූල්‍ය පනත යටතේ ලියාපදිංචිය ලැබූ රාජ්‍ය නොවන සංවිධාන වලට ලැබෙන සම්පත් රටේ නීතිමය හා ප්‍රතිපත්ති රාමුව තුළ ප්‍රශස්ථ ලෙස මහජන සුභ සිද්ධිය පිණිස ක්‍රියාත්මක වන බව තහවුරු කිරීම.
- පීඩාවට පත් පාර්ශ්වයන්ට උදව් කිරීම සඳහා හා සංවර්ධන ක්‍රියාවලියට ස්වේච්ඡාවෙන් සහභාගීවීම සඳහා දේශීය හා විදේශීය ජන සමූහයන්ට හිතකර පරිසරයක් සකස් කිරීම.

**උපාය මාර්ග**

රාජ්‍ය මැදිහත්වීම හා අධීක්ෂණය යටතේ ප්‍රතිලාභීන් වෙත සේවා සැපයීමට රාජ්‍ය නොවන සංවිධාන ආදේශක සේවා සපයන්නන් ලෙස පිළිගැනීමේ උපායමාර්ගය.

**රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ප්‍රධාන අංශ**

ඉහත සඳහන් අරමුණු ළගාකර ගැනීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන ජාතික ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරකම් පහත සඳහන් ආකාරයට සංවිධානය කර ඇත.

1. රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම හා විමර්ශන අංශය
2. රාජ්‍ය නොවන සංවිධාන අධීක්ෂණය හා සුපරීක්ෂණ අංශය
3. ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි හා අධීක්ෂණ අංශය
4. පහසුකම් හා සේවා සැපයීමේ අංශය
5. ආයතන අංශය.

**රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේ අංශය**

**අරමුණු**

- 1980 අංක 31 දරණ ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය පිළිබඳපනතේ අර්ථකථනයට ගැනෙන ස්වේච්ඡා සංවිධාන එම පනත යටතේ ලියාපදිංචි කිරීමෙන් තොරව ක්‍රියාත්මක වීම නීතිය උල්ලංඝණය කිරීමක් වග ප්‍රසිද්ධියට පත් කිරීම.
- ජාතික මට්ටමින් රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම හා දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මට්ටමේලියාපදිංචිය නියාමනය.
- රාජ්‍ය නොවන සංවිධාන තොරතුරු නාමාවලිය යාවත්කාලීන කිරීම .
- කාර්යාල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.
- පනතේ විධිවිධාන අනුව රාජ්‍ය නොවන සංවිධාන වලට එරෙහිව

ලැබෙන පැමිණිලි පිළිබඳව පරික්ෂා කිරිම සඳහා පරීක්ෂණ මණ්ඩල පත්කිරීම.

ජාතික මට්ටමේ හා අන්තර් ජාතික සංවිධාන 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන )ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම (පිළිබඳ පනත යටතේ ලියාපදිංචි කිරීම මෙම අංශය මගින් කරනු ලබයි .රාජ්‍ය නොවන සංවිධානයක් ක්‍රියාත්මක කරන්නේ කෙසේද , ව්‍යවස්ථාවක් සකස් කර ගන්නේ කෙසේද , ව්‍යාපෘති වාර්තා සැකසිය යුත්තේ කෙසේද හා ලියාපදිංචි කිරීමේ ක්‍රම වේදය පිළිබඳව අවශ්‍ය උපදෙස් ලබාදීම හා අයදුම්පත් නිකුත් කිරීම ලියාපදිංචි කිරීමේ අංශය විසින් කරනු ලබයි .දෙවනුව ලියාපදිංචිය සඳහා ලැබෙන අයදුම්පත් පරීක්ෂාකර අදාල ආරක්ෂක අංශයන් හා විදේශ කටයුතු අමාත්‍යාංශය වෙතින් නිර්දේශයන් ලබා ගැනීම සඳහා යොමු කරනු ලබයි . අදාල නිර්දේශයන් ලද පසු ලියාපදිංචි කිරීමේ සහතිකය ආයතන ප්‍රධානීන් වෙත නිකුත් කෙරේ.

### ලියාපදිංචි කිරීමේ අංශයේ ප්‍රගතිය

විදේශ කටයුතු අමාත්‍යාශය හා අරක්ෂක අමාත්‍යාංශය හා වෙනත් රේඛීය අමාත්‍යාංශයන්හි නිරීක්ෂණ හා නිර්දේශ සහිතව ඉහත පනත යටතේ රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කර සහතික නිකුත් කර ඇත.

- දේශීය අරමුදල් වලින් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන රාජ්‍ය නොවන සංවිධාන හා
- විදේශීය සංවිධාන සහ විදේශීය අරමුදල් ලැබෙන සංවිධාන ලෙස කොටස් 02 කි.
- දැනට මෙම කාර්යාලයේ ලියාපදිංචි කරන ලද සමස්ත රාජ්‍ය නොවන සංවිධාන සංඛ්‍යාව 1621 කි.

රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය තව දුරටත් විධිමත් කිරීම සඳහා නව චක්‍රලේඛයක් නිකුත් කිරීමට අවශ්‍ය මූලික පියවර ගෙන ඇත.

ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම පිණිස චක්‍රලේඛයක් කෙටුම්පත් කර ඇති අතර දිවයිනේ ක්‍රියාත්මක වන සියළුම ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීම සඳහා මධ්‍යගත අනුමැතියක් ලබා දීමේ ක්‍රමයක් හඳුන්වා දීමට අපේක්ෂිතය .එසේම ජාතික මට්ටමින් ක්‍රියාත්මක සංවිධාන මෙන්ම දිස්ත්‍රික්/ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක සංවිධාන පිළිබඳ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පවත්වාගෙන යැමටද පියවර ගෙන ඇත .

### රාජ්‍ය නොවන සංවිධාන විමර්ශන කටයුතු

1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ පනත හා 1998 අංක 08දරන සංශෝධිත පනතේ ප්‍රතිපාදන අනුව ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධාන වලට එරෙහිව ලැබෙන පැමිණිලි පිළිබඳව පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා විමර්ශන කටයුතු පැවැත්වීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි .ලිඛිතව කිසියම් සංවිධානයක් පිළිබඳ පැමිණිල්ලක් හෝ තොරතුරු ලද පසු ඒ පිළිබඳව විමර්ශනයක් සඳහා අධීක්ෂණ අංශය වෙත යොමු කෙරේ .එම පැමිණිල්ලට අදාලව පිළිගත හැකි සාක්ෂි විමර්ශන අංශය මගින් අනාවරණය කරගතහොත් පනතේ විධිවිධාන අනුව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා ගරු අමාත්‍යවරයා විසින් පරීක්ෂණ මණ්ඩලයක් පත් කරනු ලැබේ.

### අධීක්ෂණ හා සුපරීක්ෂණ අංශය

### අරමුණු

රාජ්‍ය නොවන සංවිධාන වලට ලබා ගන්නා සම්පත් පරිහරණය ආයතනයේ යොමුගත අරමුණු හරහා මහජන ප්‍රතිලාභ ප්‍රශස්ත වන අයුරින් ඉටු වනවාද යන්න පසු විපරම් කරන අතර, ආයතන හා ඒවායේ සම්පත් අනිසි ලෙස නෛතික භාවයක් නොමැති

කටයුතු වල යොදාගැනිම වැලැක්වීම සහ අවම කිරීම.

**උපාය මාර්ග**

01. මුලාශ්‍රයන් සහිත වු සියළුම ලැබිම්, ඒවා පරිහරණය කිරීම් හා පරිහරණයකිරීමේ ක්‍රියාවලින්ද,අවසන් ප්‍රතිලාභීන්ද ඇතුලත් වු අරමුදල් කළමනාකරණය රෙගුලාසි කිරිම.
02. රාජ්‍ය නොවන සංවිධාන වල දේශීය හා විදේශීය ක්‍රියාකාරකම් පසු විපරම් කිරිම සඳහා අන්තර් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු එළඹුමක් ප්‍රයෝජනයට ගැනිම.

**වැඩසටහන්/ක්‍රියාකාරකම්**

- රාජ්‍ය නොවන සංවිධාන වර්ගීකරණය
- රාජ්‍ය නොවන සංවිධාන වල ක්‍රියාකාරී සැලසුම්වලට අදාළව ප්‍රගතිය පසු විපරම් කිරිම
- රාජ්‍ය නොවන සංවිධාන අධීක්ෂණය පිළිබඳ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු පැවැත්වීම.

**අධීක්ෂණ හා සුපරීක්ෂණ අංශයේ ප්‍රගතිය**

ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධාන ජාතික ලේකම් කාර්යාලය වෙත ප්‍රතිචාර දක්වන ආකාරය අනුව කොටස් 4කට වර්ගීකරණය කර ඇති අතර ,විදේශීය අරමුදල් ලැබෙන රාජ්‍ය නොවන සංවිධාන අධීක්ෂණ කටයුතු ආරම්භ කර ඇත .මේ සම්බන්ධව පහත සඳහන් වැඩසටහන් දියත් කර ඇත.

**රාජ්‍ය නොවන සංවිධාන වර්ගීකරණය**

රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේ ලේඛණය අනුව ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධාන සංඛ්‍යාව 1605 කි .එම රාජ්‍ය නොවන සංවිධාන වර්ගීකරණය මෙම කාර්යාලයට වාර්තා ඉදිරිපත් කිරීම මත පදනම් වී ඇති අතර ,ඒ අනුව පහත සඳහන් පරිදි රාජ්‍ය නොවන සංවිධාන වර්ගීකරණය කර ඇත.

01. 75% වඩා ප්‍රතිචාර දක්වන රාජ්‍ය නොවන සංවිධාන
02. 50-75% අතර ප්‍රතිචාර දක්වන රාජ්‍ය නොවන සංවිධාන
03. 50% අඩුවෙන් ප්‍රතිචාර දක්වන රාජ්‍ය නොවන සංවිධාන
04. ප්‍රතිචාර නොදක්වන රාජ්‍ය නොවන සංවිධාන

ප්‍රතිචාර නොදක්වන සංවිධාන ක්‍රියාකාරීද නැද්ද යන්න හදුනා ගැනීම සඳහා කාර්යාලීය හා පෞද්ගලික ලිපිනයන්ට ලිපි යැවීම ,දුරකථන ඇමතුම් ,විද්‍යුත් ලිපි මගින් තොරතුරු සනාථ කර ගැනීම ,දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් මගින් තොරතුරු විමසීම යන ක්‍රියාමාර්ග ගෙන ඇත .

අධීක්ෂණ හා සුපරීක්ෂණ කාර්යයේදී රාජ්‍ය නොවන සංවිධාන වලින් පහත සඳහන් තොරතුරු ලබාගැනීම සිදු කරනු ලබයි.

01. සංවිධාන විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති පිළිබඳ විස්තර ලබා ගැනීම
02. අරමුදල් ලැබීම් පිළිබඳ විස්තර
03. අරමුදල් වියදම් කිරීම පිළිබඳ විස්තර
04. සේවක මණ්ඩල තොරතුරු
05. වත්කම් පිළිබඳ තොරතුරු
06. වාර්ෂික විගණන වාර්තා

**දිස්ත්‍රික් අධීක්ෂණ කටයුතු**

රාජ්‍ය නොවන සංවිධාන වල දිස්ත්‍රික් මට්ටමේ ක්‍රියාකාරකම් අධික්ෂණය කිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ස්ථාපිත කර ඇත .දිස්ත්‍රික් අධීක්ෂණ කටයුතු සඳහා සංවර්ධන නිලධාරීන් දිස්ත්‍රික් **22** ක් සඳහා අනුයුක්ත කර ඇත .

මෙයට අමතර වශයෙන් ජාතික ,දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳව ලැබෙන පැමිණිලි/පෙත්සම් පදනම් කර ගනිමින් අධීක්ෂණ අංශය විසින් රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ විමර්ශන කටයුතු සිදු කරනු ලැබේ. අධීක්ෂණ අංශයේ

අනාවරණයන්ට අනුව අවශ්‍ය වේ නම් එම සංවිධාන පිළිබඳ පුළුල් විමර්ශනයක් සඳහා පරීක්ෂණ මණ්ඩලයක් වෙත යොමු කරනු ලැබේ .දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් මගින එවැනි මූලික විමර්ශන සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධ උපදෙස් අතිරේක/සහකාර රෙජිස්ට්‍රාර්වරුන් වෙත යොමුකරනු ලැබේ .

**ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි හා අධීක්ෂණ අංශය**

ක්ෂුද්‍ර මූල්‍ය පනත යටතේ රීති සම්පාදන කටයුතු සිදුකර ගැසට් පත්‍රය පළකිරිමට කටයුතු යොදන ලදි. රාජ්‍ය නොවන සංවිධාන වල දිස්ත්‍රික් මට්ටමේ ක්‍රියාකාරකම් අධික්ෂණය කිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ස්ථාපිත කර ඇත.දිස්ත්‍රික් අධීක්ෂණ කටයුතු සඳහා සංවර්ධන නිලධාරීන් දිස්ත්‍රික් 11ක් සඳහා අනුයුක්ත කර ඇත .ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේ කටයුතු මේවනවිට ආරම්භ කර ඇති අතර , දැනටමත් එවැනි සංවිධාන 46 ක් ලියාපදිංචිය සඳහා අයුදුම්කොට ඇත .එම සංවිධාන ඇගයීම හා අධීක්ෂණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර ,එම සියළු කටයුතු නිම කරන ලද සංවිධාන **13**ක් ලියාපදිංචි කර ඇත.ක්ෂුද්‍ර මූල්‍ය පනත හා එහි රෙගුලාසි පිළිබඳව දිස්ත්‍රික් **25** හේ ක්ෂුද්‍ර මූල්‍ය සංවිධාන දැනුම්වත් කිරීමේ වැඩ සටහන් පවත්වා ඇත.

ජාතික වැවැලි කළමනාකරණ ආයතනය මගින් මෙහෙයවනු ලබන ක්ෂුද්‍ර මූල්‍යකරණ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවට සියළුම දිස්ත්‍රික් සම්බන්ධීකාරවරුන් යොමු කර පුහුණුව ලබාදුන් අතර මහබැංකුවේ බැංකු විදූ පියස යටතේ පවත්වනු ලබන ක්ෂුද්‍ර මූල්‍ය සංගම්වල ක්‍රියාකාරිත්වය ,මූල්‍ය රෙගුලාසි හා අවදානම් කළමනාකරණය පුහුණු වැඩමුළුව හරහා ද සියලු දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරන් හා ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ නිලධාරීන් යොමුකර පුහුණුව ලබා දෙන ලදි.

මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලද අතර ,දිස්ත්‍රික්ක මට්ටමින් සියළුම ග්‍රාම නිලධාරීන් සඳහා මූල්‍ය සාක්ෂරතාවය ලබා දීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදි.

**පහසුකම් හා සේවා සැපයීම් අංශය**

**අරමුණු**

1980අංක 31 දරණ ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීම හා අධික්ෂණය පිළිබඳ පනත යටතේ ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධාන/ස්වේච්ඡා සංවිධාන ප්‍රතිඵල ළගාකර ගැනීම සඳහා මනාව පවත්වාගෙන යෑම පිණිස ලබාදිය හැකි පහසුකම් හා සේවාවන් සැපයීම් මෙම අංශයේ අරමුණය.පහසුකම් හා සේවා සැපයීම් අංශය මගින් සපයනු ලබන සේවාවන් පහත පරිදි වේ.

1. වීසා නිර්දේශ කිරීම/වැඩබලපත් නිකුත් කිරිම
2. තීරු බදු සහන නිර්දේශ ලබාදිම
3. ආනයන බදු සහන සඳහා නිර්දේශය ලබාදිම
4. ප්‍රවීණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
5. ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සිවිලි සමාජ සම්මෙලන ස්ථාපිත කිරිම සහ ධාරිතා වර්ධනය
6. රාජ්‍ය නොවන සංවිධාන වල වෙනත් ඉල්ලීම් සඳහා මැදිහත් විම

**වීසා/වැඩ බලපත්‍ර ලබාදීම**

ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධාන වල සේවයෙහි නියුතු විදේශිකයන් සඳහා අවශ්‍ය වීසා නිර්දේශ හා වැඩ බලපත්‍ර ලබාදීම මෙම අංශය මිගින් සිදු කරනු ලබයි .අභ්‍යන්තර පරිපාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 01/2008 වීසා චක්‍රලේඛයේ විධිවිධාන පරිදි රාජ්‍ය නොවන සංවිධාන වල සේවය සඳහා

පැමිණෙන විදේශිකයන් සඳහා රටට ඇතුළුවීමේ වීසා හා නේවාසික වීසා නිකුත් කිරීම හා දීර්ඝ කිරීම සඳහා ආගමන විගමන පාලක වෙත නිර්දේශය ලබාදේ .එහිදී නිර්දේශ ලබාදීමේ දී අදාල දිස්ත්‍රික් ලේකම්ගේ එකඟතාව ලබාගැනීම සිදුකෙරේ. මීට අමතරව කෙටිකාලීන සේවාවක් සඳහා පැමිණෙන ස්වේච්ඡා සේවකයින් මෙන්ම රැස්වීම් ,සාකච්ඡා සම්මන්ත්‍රණ ආදිය සඳහා පැමිණෙන විදේශිකයින් සඳහා කෙටිකාලීන විසා නිර්දේශ නිකුත් කිරීම සිදු කෙරේ.

ආනයන බදු සහන සඳහා නිර්දේශයන් ලබාදීම

දිළිඳු සහ අවශ්‍යතා සහිත පුද්ගලයින් වෙත ලබාදීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන විසින් විදේශීය රටවලින් ආනයනය කරනු ලබන භාණ්ඩ සඳහා තීරු බදු සහන ලබාගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම , පසුකම් හා සේවා සැපයීමේ අංශය විසින් කරනු ලබයි .පනත යටතේ ලියාපදිංචි වී ඇති හා මෙම කාර්යාලයේ අධීක්ෂණ අංශයේ හා සුපරීක්ෂණ අංශයේ අවශ්‍යතා සම්පූර්ණ කර ඇති සංවිධාන හා දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය මත තීරු බදු සහන නිර්දේශය ලබාදී කරනු ලබයි .

**ප්‍රාදේශීය හා සිවිල් සමාජ සම්මේලන**

ප්‍රාදේශ්‍රීය වශෙයන් සිවිල් සමාජ සම්මේලන 332ක් හා දිස්ත්‍රික් මට්ටමින් සිවිල් සමාජ සම්මේලන 25ක් ස්ථාපිත කිරිමට කටයුතු යොදා ඇති අතර, 2019 අවසන් වන විට ප්‍රාදේශීය සිවිල් සමාජ සම්මේලන 263ක් හා දිස්ත්‍රික් සිවිල් සමාජ සම්මේලන 24ක් ස්ථාපිත කර ඇත . එමෙන්ම එම සංවිධානවල ප්‍රධානින් එනම් සභාපති ,ලේකම් හා අනු කමිටු නිලධාරීන් දැනුම්වත් කිරීමේ කටයුතු සිදුකර ඇත .

ඊට අමතරව ළමා මානව හිමිකම් හා ප්‍රජාතන්ත්‍රවාදය, සහජීවනය, මත්ද්‍රව්‍ය නිවාරණය හා කාන්තා සංවර්ධනය පිළිබඳව අනුකමිටු පිළිබඳ දැනුවත් කිරිමට අදාල වැඩමුළු පවත්වා ඇත. එමෙන්ම දිස්ත්‍රික් ධාරිතා වර්ධනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් ද මේවනවිට පවත්වා ඇත.

එමෙන්ම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය වශයෙන් වෙන වෙනම ආදර්ශ ව්‍යවස්ථාවක් සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් මුද්‍රණය කර බෙදා හැරීම සිදු කරන ලදි.

## 2.2.5 ජාතික සමගිය හා සංහිඳියා කාර්යංශය ( ONUR ) හා එහි ප්‍රගතිය.

**ජාතික සමගිය හා සංහිඳියා කාර්යංශය ස්ථාපිත කිරීම සඳහා වූ නෛතික ප්‍රතිපාදන**

ජාතික සමගිය හා සංහිඳියා කාර්යංශය අතිගරු ජනාධිපතිතුමා යටතේ ස්ථාපිත කරනු ලැබුවේ ගරු කථානායකවරයා විසින් ඉදිරිපත් කරන ලද වර්ෂ 2015 . මාර්තු 25 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය පදනම් කරගනිමින් , වර්ෂ 2015 අප්‍රේල් 08 වැනි දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරවය.

ජාතික ඒකාබද්ධතා හා සංහිඳියා අමාත්‍යාංශය යටතේ , සංහිඳියාවට අදාල කටයුතු අංක 1945/41 හා 2015.12.18 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ජාතික සමගිය හා සංහිඳියා කාර්යාලය වෙත පවරන ලදී.වර්ෂ 2018 දී , ජාතික සමගිය හා සංහිඳියා කාර්යංශයේ කාර්යයන් සහ කටයුතු ජාතිය, ජාතික සමගිය හා සහජීවනය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය යටතට පවරනු ලැබීය.

දැනට , ජාතික ඒකාබද්ධතා , රාජ්‍ය භාෂා , සමාජ ප්‍රගති හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ මෙහෙවර ක්‍රියාවට නැංවීමේ කාර්යයභාරය ඉටු කිරීමේ වගකීම 2018.12.28 දිනැති ශ්‍රී ලංකා රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් එම අමාත්‍යාංශයේ නියෝජිතායතනයක් වශයෙන් ජාතික සමගිය හා සංහිඳියා කාර්යංශය වෙත පවරනු ලැබ ඇත.

**ජාතික සමඟිය සඳහා වූ මාර්ග සිතියම**

ජාතික සමගිය සාක්ෂාත් කර ගැනීමේ කර්තව්‍යයේ දී ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කළ , බහුවිධ ප්‍රවේශයක් වැදගත් වේ. මේ සම්බන්ධයෙන් , ශ්‍රී ලංකාවේ ජාතික සමගිය හා සංහිඳියාව ගොඩනැංවීමේ ක්‍රියාවලිය, දිවයිනේ උතුර, දකුණ, නැගෙනහිර හා බටහිර යනාදී කවර ප්‍ර දේශයක වුවද ජීවත් වන ජනයාගේ ජීවිතවලට බලපාන්නාවූ විවිධ අංශ සමඟ සැබැදී පවතින බව ජාතික සමඟිය හා සංහිඳියා කාර්යංශය විශ්වාස කරයි.

ජාතික සමඟිය හා සංහිඳියාව ගොඩනැංවීමෙහිලා ඉවහල් වන ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කොට ක්‍රියාවට නැංවීම, සම්බන්ධීකරණය කිරීමේ වගකීම ජාතික සමගිය හා සංහිඳියා කාර්යංශය සතුවේ. ජාතික සමඟිය හා සංහිඳියා කාර්යංශයේ මූලික කාර්යභාරයට ඇතුලත් වන්නේ , ශ්‍රී ලංකාවේ සියලු ජනයා අතර අන්‍යෝන්‍ය සබඳතා ගොඩනැංවීම තුළින් කල්පවත්නා සාමයක් සහතික කිරීමයි.

ජාතික සමගිය හා සංහිඳියා කාර්යංශය ස්වකීය මෙහෙවරට අනුව , සංකල්ප ගොඩනගමින් වැඩසටහන් සැලසුම් කිරීම, අරමුදල් සම්පාදනය හා මධ්‍යම ආණ්ඩුව, පළාත් සභා, සිවිල් සමාජ සංවිධාන, සංවර්ධන පාර්ශ්වකරුවන් සහ අනෙකුත් පාර්ශවයන් සමඟ ජාතික සමඟිය හා සංහිඳියාව ඇති කරලීම සඳහා සහයෝගයෙන් කටයුතු කරයි.

**දැක්ම**

සියලු පුරවැසියන් සඳහා ආර්ථික, සමාජීය, සංස්කෘතික හා දේශපාලනික ක්ෂේත්‍රයන් තුළ සමාන අවස්ථා සහතික කිරීම ද ඇතුළුව විවිධත්වයට හා ජාතික අනන්‍යතාවයට ගෞරව කරමින් හා ඒවා අගයමින් සියලු ශ්‍රී ලාංකිකයන් සහජීවනයෙන් එක්සත්ව හා එක්සිත්ව සිටින ශක්තිමත්, තිරසාර, ප්‍රගතිශීලී, පරිපූර්ණ හා සාමයට ලැදි ජාතියක් ගොඩනැංවීම.

**මෙහෙවර**

මූලික අයිතිවාසිකම්, නිදහස, නීතියේ ආධිපත්‍ය , සමානාත්මකතාව හා විවිධත්වය ගරුකරන්නා වූද ජනවාර්ගිකත්වය, භාෂාව, කුලය, වයස , ස්ත්‍රී - පුරුෂ භාවය, ලිංගික දිශානතිය, උපන් ස්ථානය හා දේශපාලන මතය නොතකා සියලු පුරවැසියන්ට අභිමානවත් ලෙස හා වෙනසක් නොකොට සලකමින් ගෞරව කරන්නා වූ ද සමාජයක් ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා කටයුතු සම්පාදනය කිරීම.

**පරමාර්ථ**

i. විවිධ ප්‍රජාවන් අතර පවත්නා ආතතීන්වලට හා ගැටුම්වලට තුඩු දෙන්නාවූ ගැටලු විසඳීම සඳහා ගතයුතු පියවර පිළිබඳව රජයට නිර්දේශ කිරීම හා ඒවා ක්‍රියාවට නැංවීම අන්වේෂණය කිරීම.
ii. සියලු ප්‍රජාවන් අතර අවබෝධය, සාමකාමී බව හා එක්සත්භාවය ගොඩ නැංවෙන සංහිඳියාව සඳහා වූ වැඩසටහන් සම්පාදනය කොට රජයට නිර්දේශ කිරීම සහ පසුව ඒවා ක්‍රියාවට නැංවීම අන්වේෂණය කිරීම.

ජාතික සමගිය හා සංහිඳියා කාර්යංශය පාලක මණ්ඩයේ සංයුතිය ශ්‍රී ලංකාවේ හිටපු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය මෙම පාලක මණ්ඩලයේ සභාපතිනිය වන අතර , ස්වකීය වෘත්තීය ජීවිතයෙහි විශිෂ්ටත්වයට පත්වූ හා බහු ආගමික , වාර්ගික, වෘත්තීය හා අධ්‍යාපනික පසුබිමක් නියෝජනය කරන්නාවූ ප්‍රවීණ පුද්ගලයන් මෙම පාලක මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් කටයුතු කරමින් සිටිති.

වර්ෂ 2019 කාල පර්ච්ඡේදය තුළ. පහත සඳහන් වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාවට නංවා තිබේ.

- ශ්‍රී ලංකාවේ සංහිඳියාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය
- සමාජ ඒකාබද්ධතා අධ්‍යාපනය
- ගැටුම් පරිවර්තනය
- මනෝසමාජීක උපකාරක ව්‍යාපෘතිය
- කලා හා සංස්කෘතික සංහිඳියාව
- දැනුවත් කිරීම් හා සමාජගත කිරීම්
- සමස්ත දිස්ත්‍රික් සංවර්ධන සැළසුම් වැඩසටහන(DDP)යටතේ උතුරු සහ නැගෙනහිර පළාත්වල ආර්ථික කටයුතු සඳහා දායක කරගැනිමේ වැඩසටහන.

දායක ප්‍රජාව සහ දේශිය හා ජාත්‍යන්තර සංවිධානවල සහාය ඇති උතුර සහ නැගෙනහිර පළාත්වල ජිවත්වන දහස් ගණන් පුද්ගලයන්ගේ , රාජ්‍ය සේවකයන්ගේ, සිවිල් සමාජ නියෝජිතයන්ගේ හදවත් දිනාගනිමින් මෙම ව්‍යාපෘතිය හරහා ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශය ජාතික සංහිඳියා උපාය මාර්ග තුළ ප්‍රධාන කාර්යයභාරයක් ඉටුකොට ඇත.

## 2.2.6 හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

**හැඳින්වීම**

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව 1986 ජනවාරි මස 01 වැනි දින පිහිටුවනු ලැබූ අතර දැනට එය ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියත්මක වේ.

**දැක්ම**

ශ්‍රී ලංකාව තුළ හින්දු ආගම සහ සංස්කෘතිය සුරක්ෂිත කිරීම සහ මනාව පිහිටු වීම.

**මෙහෙවර**

හින්දු ආගම, හින්දු සංස්කෘතිය, කලා සහ හින්දු ආගමික අධ්‍යාපනය සුරක්ෂිත කිරීමට, ප්‍රවර්ධනය කිරීමට සහ පෝෂණය කිරීමට සක්‍රීය වශයෙන් දායක වීම.

**අරමුණු**

- හින්දු ආගමික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම.
- හින්දු ආගමික කටයුතු ප්‍රවර්ධනය කිරීම.
- හිනදු ආගම හා සංස්කෘතිය පිළිබඳ පර්යේෂණ කිරීම.
- හින්දු සංස්කෘතිය හා කලාව ප්‍රවර්ධනය කිරීම.

**දෙපාර්තමේන්තුව මඟින් ඉටුකරනු ලබන ප්‍රධානකාර්යයන්**

- හින්දු දහම් පාසල් සංවර්ධනය කිරීම.
- හින්දු පූජකවරුන් පුහුණු කිරීම.
- හින්දු කෝවිල් ප්‍රතිසංස්කරණය කිරීම.
- හින්දු පර්යේෂණ පුස්තකාල පරිපාලනය කිරීම.
- කතරගම හින්දු වන්දනාවේ විශ්‍රාම ශාලාව පාලනය කිරීම.
- මඩකලපුව හින්දු සංස්කෘතික මධ්‍යස්ථානයේ පරිපාලනය.
- ආනිපණ්ඩිත් ගුරුකුල මධ්‍යස්ථානය පරිපාලනය කිරීම.
- යාපනයේ නාවලර් මනිමණ්ඩපම් පරිපාලනය කිරීම.
- හින්දු හා දෙමළ සංස්කෘතිය පිළිබඳ පර්යේෂණ කිරීම.
- හින්දු විශ්ව කෝෂ සම්පාදනය කිරීම.
- හින්දු සංස්කෘතිය හා කලාව සංස්කරණය කිරීම.
- හින්දු උත්සව හරහා සම්ප්‍රදායයන් ආරක්ෂා කිරීම'

## 2.2.6 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

**හැඳින්වීම**

2016 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම,පරිපාලනය සහ කර්තව්‍ය ඉටුකිරීම) පනත 2016 අගෝස්තු මස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදි.පනතේ ප්‍රතිපාදන අනුව අණුඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත අතිගරු ජනාධිපතිතුමන් විසින් එකී කාර්යාලය සඳහා පහත සඳහන් තැනැත්තන් සභාපති හා කොමසාරිස්වරුන් වශයෙවන් පත්කරන ලදි.

1. ජනාධිපති නීතිඥ සාලිය පීරිස් මහතා - සභාපති
2. ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු මහත්මිය - කොමසාරිස්
3. නීතිඥ එස්.කේ. ලියනගේ මහතා - කොමසාරිස්
4. මෙජර් ජනරාල් (විශ්‍රාමික) මොහන්ති පීරිස් මහත්මිය - කොමසාරිස්
5. ජයදීපා පුණ්‍යාමූර්ති මහත්මිය - කොමසාරිස්
6. මීරාක් රහීම් මහතා - කොමසාරිස්
7. කනපතිපිල්ලෙයි වෙන්තන් මහතා - කොමසාරිස්

2018 පෙබරවාරි 28 දින පත්කරන ලද එකී සභාපතිගේ සහ කොමසාරිස්වරුන්ගේ ධුර කාලය වසර තුනකි.

මෙම කාර්යාලයට පුද්ගලයන් අතුරුදහන් වීමේ වාතාවරණයන් සහ ඔවුන්ගේ ඉරණම පැහැදිලි කිරීමට ,එය නැවත සිදු නොවන බව පැහැදිළි කිරීමට,එය නැවත සිදුනොවන බව සහතික කිරීම සඳහා අදාළ බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීමට, අතුරුදහන් සහ සොයා ගත නොහැකි පුද්ගලයන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ වුවමනාවන් සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට,අතුරුදහන් සහ සොයා ගත නොහැකි පුද්ගලයන් සඳහ සහන ලබා දීමේ මාර්ග හඳුනා ගැනීමට ,අතුරුදහන් සහ සොයා ගත නොහැකි පුද්ගලයන්ට අදාළ දත්ත පවතින මූලාශ්‍ර වලින් ලබා ගැනිමට සහ ලබා ගත හැකි සියළු තොරතුරු දත්ත බැංකුවක මධ්‍යගත කිරීමට පැහැදිළි අධිකාරියක් ලබා දී ඇත.

රෙජිස්ට්‍රාර් ජනරාල්ට දක්නට නොමැති බවට සහතිකයක් නිකුත් කිරීමට හැකිවන පරිදි ඥාතීන්ට අවස්ථාව ලබා දීම සඳහා අතුරු වාර්තා නිකුත් කිරීම, අතුරුදහන් සහ සොයා ගත නොහැකි පුද්ගලයන්ගේ ඥාතීන්ට මනෝ සමාජීය ආධාර ඇතුලත්,පරිපාලන ආධාර සහ සුභ සාධන සේව ලබා දිමහෝ එය පහසු කීරීම, අතුරුදහන් වූ හෝ සොයා ගත නොහැකි තැනැත්තන්ට හෝ ඔවුන්ගේ ඥාතීන්ට හානී පූර්ණය ලබා දීම සඳහා අදාළ බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීම,වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමට ක්‍රමයක් සකස් කිරීම සහ බලාත්මක කිරීම, අතුරුදහන් සහ සොයා ගත නොහැකි පුද්ගලයන් සම්බන්ධ සියළු විස්තර ඇතුලත් දත්ත බැංකුවක් නිර්මාණය කිරීම. කළනාකරණය සහ පවත්වා ගැනීම, අතුරුදහන් වූ සහ සොයාගත නොහැකි තැනැත්තන්ගේ පවුල් වල සාමාජිකයන් තුළ පවත්නා වේදනාව සහ ඔවුන්ට සිදුව ඇති හානිය පිළිබඳව ජනතාවගේ දැනුවත් භාවය සහ සංවේදීතාවය ඇති කරවීම සහ ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට සාමාන්‍ය ජනතාව අතර සහාය පහසු කරණය සහ ආර්ථික, මනෝ සාමාජයීය, නෛතික සහ පරිපාලනමය සහාය ලබා ගැනීම තහවුරු කිරීම ඇතුළත් කාර්යයන් සහ වගකීම් රැසක් මෙම කාර්යාලයට පැවරී ඇත.

අතුරුදහන් වූ තැනැත්තන් සඳහා වූ කාර්යාලයට නියමයන් සෑදීමට, සුත්‍රී පුරුෂ සමාජ භාවයට සංවේදී මාර්ගෝපදේශ වර්ධනය කිරීමට, කාර්ය මණ්ඩල බඳවා ගැනීමට සහ සේවයෙන් පහ කිරීමට හා කාර්යක්ෂමව ක්‍රියාත්මකවීමට අවශ්‍ය

ඒකක ස්ථාපනය කිරීමට බලතල පැවරී ඇත. වැඩිදුරටත් මෙම කාර්යාලයට අනාගතයේ අතුරුදහන්වීම් සිදුවීම වැළැක්වීම, අතුරුදහන් වූ තැනැත්තන් අනුස්මරණය කිරීමට සහ ඒ බව පිළිගැනීමට මාර්ග සහ ක්‍රම, හඳුනාගත නොහැකි සහ හඳුනාගත හැකි මළ සිරුරු සම්බන්ධයෙන් කටයුතු කිරීම, මහජනයා දැනුවත් කිරීම සඳහා අතුරුදහන් පුද්ගලයන්ට අදාල තොරතුරු ප්‍රකාශයට පත් කිරීම, අතුරුදහන් වූ තැනැත්තන්ට අදාළ ජාතික නීති සහ රෙගුලාසි වර්ධනය කිරීම, අතුරුදහන් සහ සොයාගත නොහැකි තැනැත්තන් හා ඔවුන්ගේ ඥාතීන්ගේ සමාජ සහ ආර්ථික තත්ත්වයන් වැඩිදියුණු කිරීම සහ හානි පූර්ණ ලබා දීම, මනෝ සමාජයීය සහය ලබා දීම ඇතුළත් කරුණු ගණනාවකට අදාළ නිර්දේශ අදාළ බලධාරීන් වෙත ඉදිරිපත් කිරීමට ඇති බලය ඇත.

විමර්ශන කටයුතු පැවැත්වීම සඳහා පැමිණිලි ලබා ගැනීමට, අතුරුදහන් හෝ සොයාගත නොහැකි ස්ථාන දැනගැනීමට පරීක්ෂණ සහ විමර්ශන ආරම්භ කිරීමට, අදාල තැනැත්තන් කැඳවීම ඇතුළත් සිද්ධීන් විමර්ශනය කිරීමට අවශ්‍ය සියලු පියවර ගැනීමට, රහස්‍ය තොරතුරු හෝ රහසිගතව තොරතුරු ලබාගැනීමට, රහස්‍ය රැක ගැනීමේ කොන්දේසි යටතේ තොරතුරු ලබා ගැනීමට, මිනී වළවල් කැණීමට සහ මළ සිරුරු ගොඩ ගැනීමට මහේස්ත්‍රාත් අධිකරණයකින් නියෝගයක් ලබා ගැනීම සඳහා අයදුම් කිරීමට සහ එවැනි කටයුතුවලට නිරීක්ෂකයෙකු වශයෙන් සහභාගී වීමට, රාජ්‍ය අංශයෙන් අවශ්‍ය සහායක් ඉල්ලා සිටීමට, පුද්ගලයන් රඳවා සිටින ස්ථාන වරෙන්තුවක් නොමැතිව පරීක්ෂා කිරීමට සහ අනාවරණය වූ වැරදි අදාළ නීති බලාත්මක කරන හෝ නඩු පැවරීමේ බලධාරීන්ට වාර්තා කිරීම ඇතුළත් සිද්ධීන් විමර්ශනය කිරීමට අවශ්‍ය සියලු පියවර ගැනීමට මෙම කාර්යාලයට විශේෂිත බලතල ඇත. කිසියම් පුද්ගලයෙකු අතුරුදහන් වුවත් පිළිබඳ කාර්යාලය ඉදිරියේ පෙනී සිටීමට අපොහොසත් වීමට හො මෙම කාර්යාලයෙන් නිකුත් කරන ලද සිතාසියකට අනුකූලව ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂප කිරීම, මෙම කාර්යාලයෙන් ඔහුට හෝ ඇයට කරන ලද දැනුම් දීමක් හෝ ලිඛිත නියෝගයක දක්වා ඇති ආකාරයට හේතුවක් නැතිව ප්‍රශ්නවලට පිළිතුරු දීම හෝ පිළිපැදීම ප්‍රතික්ෂේප කිරීම, මෙම කාර්යාලයේ නිලධාරියෙකුට ඔවුන්ගේ බලතල ක්‍රියාත්මක කිරීමට විරෝධය දැක්වීමට හෝ එය වැළැක්වීම හෝ මෙම කාර්යාලයේ කාර්යයන්ට දැනුවත්ව බාධා කිරීම ඇතුළත් හේතූන් ගණනාවක් සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පළිබඳ කාර්යාලයෙ අධිකාරියට එරෙහිවීම, අපහාස කිරීමේ වරදකට වැරදිකරුවෙකු විය හැකි ය.

මෙම කාර්යාලය අතුරුදහන් සහ සොයාගත නොහැකි තැනැත්තන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ අයිතිවාසිකම් සහ වුවමනාවන් හි වැදගත්කම පිළිගැනෙන ආකාරයෙන් සිය අධිකාරී බලය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. ඊට අමතරව මෙම කාර්යාලය සිය කාර්යයන් සහ වගකීම් නීතියේ ආධිපත්‍ය තහවුරු වන ආකාරයට සහ පවතින නීති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම පහසු වන ආකාරයට සිදු කර ඇත.

# තුන්වන පරිච්ඡේදය

# 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

| අයවැය 2019 | | සටහන | තත්‍ය 2019 | තත්‍ය 2018 | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 719,083,470 | 430,305,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 4,220,593 | 445,274 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 16,302,830 | 14,618,027 | ඒසීඒ-5 |
| - | වෙනත් ලැබීම් | | 9,895,883 | 8,022,951.00 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **749,502,776** | **453,391,252** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **749,502,776** | **453,391,252** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 293,060,000.00 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 210,799,175 | 201,033,511 | ඒසීඒ-2(ii) |
| 182,150,000.00 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 114,700,119 | 114,821,581 | ඒසීඒ-2(ii) |
| 666,000,000.00 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 186,143,502 | 83,690,754 | ඒසීඒ-2(ii) |
| - | පොලී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ඒසීඒ-2(ii) |
| 1,141,210,000.00 | **මුළු පුනරාවර්තන වියදම් (ඈ)** | | **511,642,796** | **399,545,846** | |
| | **මූලධන වියදම්** | | | | |
| 7,350,000.00 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 18,465,557 | 4,792,242 | ඒසීඒ-2(ii) |
| 29,900,000.00 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 19,653,540 | 40,666,742 | ඒසීඒ-2(ii) |
| 1,373,000,000.00 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 918,007,681 | 39,023,831 | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 27,000,000.00 | හැකියා වර්ධනය | 14 | 8,167,268 | 1,693,159 | ඒසීඒ-2(ii) |
| 1,435,000,000.00 | වෙනත් මූලධන වියදම් | 15 | 1,064,220,909 | 259,720,443 | ඒසීඒ-2(ii) |
| 2,872,250,000.00 | **මුළු මූලධන වියදම් (ඉ)** | | **2,028,514,955** | **345,896,417** | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **20,687,594** | **24,621,104** | |
| | **තැන්පතු ගෙවීම්** | | 4,232,803 | 491,106 | ඒසීඒ-4 |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 16,454,791 | 24,129,998 | ඒසීඒ-5 |
| | **මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)** | | 2,560,845,345 | 770,063,367 | |
| 4,013,460,000.00 | **..........දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)** | 1 | (1,811,342,569) | (316,672,115) | |

## 3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

### 2019 දෙසැම්බර් 31 දිනට
### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තත්‍ය 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 310,031,702 | 251,215,324 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 46,544,533 | 46,392,572 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **356,576,235** | **297,607,896** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | 46,100,326 | 45,981,080 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 310,031,702 | 251,215,324 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 444,207 | 411,492 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **356,576,235** | **297,607,896** |

පිටු අංක....5....සිට ....66... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ...67.... සිට ....91.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

..............................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

..............................
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2020.02.26

..............................
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2020.02.26

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

ගීතාමනී සී. කරුණාරත්න
ලේකම්
මානව හිමිකම් සහ නීති ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය
නො. 40, බුත්ගමුව පාර, රාජගිරිය

තරංගනී එන්. ගුණවර්ධන
ප්‍රධාන ගණකාධිකාරී
ජාතික ඒකාබද්ධතාවය හා ප්‍රතිසන්ධානය පිළිබඳ අංශය
අධිකරණ මානව හිමිකම් සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
නො. 40, බුත්ගමුව පාර, රාජගිරිය.

## 3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | කතය 2019 රු. | 2018 රු. |
|---|---|---|
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| මුළු බදු ලැබීම | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 5,239,408 | 445,368,301 |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | - | - |
| අග්‍රිම ලැබීම් | 719,083,470 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **724,322,878** | **445,368,301** |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 197,164,696 | 204,114,607 |
| සහනාධාර සහ මාරුකිරීම් | 101,592,534 | 795,914 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 8,197,333 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 48,620 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **307,003,183** | **204,910,521** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **417,319,695** | 240,457,780 |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම | 786,685 | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **786,685** | - |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 403,764,774 | 240,457,780 |
| අත්තිකාරම් ගෙවීම් | 14,328,369 | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **418,093,144** | **240,457,780** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(417,306,459)** | (240,457,780) |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **13,236** | - |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 4,147,543 | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **4,147,543** | - |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 4,160,779 | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **4,160,779** | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **(13,236)** | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ) -(ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

3

## 3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

**වාර්තාකිරීමේ පදනම**

1) **වාර්තාකරණ කාලපරිච්ඡේදය**
2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) **මිනුම්කරණ පදනම**
මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත.අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියල කිරිම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) **ආදායම් හඳුනාගැනීම**
හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා , මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) **දේපළ , පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**
වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ , පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ , පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළනොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) **දේපළ , පිරියත හා උපකරණ සංචිතය**
මෙම සංචිත ගිණුම දේපළ ,පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) **මුදල් හා මුදල් සමාන දෑ**
2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

**3.6** ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| ආදයම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| | අදාළ නැත | | | | |

**3.7**වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 1,141,210.00 | 1,183,110.00 | 511,643.00 | 43.25% |
| ප්‍රාග්ධන | 2,872,250.00 | 4,273,873.00 | 2,028,515.00 | 47.46% |

**3.8** මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01 | අග්‍රමාත්‍ය කාර්යාලය | | 4,340.00 | 4,340.00 | 4,340.00 | 100% |
| 02 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | පුහුණු සංවර්ධන නිලධාරීන් හට දීමනා ගෙවීම | 4,098.00 | 4,098.00 | 4,051.00 | 98.85% |

**3.9** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2019 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 25,648.00 | 25,648.00 | - | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 282,433.00 | 282,433.00 | - | 100% |
| 9153 | ඉඩම් | 1,950.00 | 1,950.00 | - | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

## 3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ශීර්ෂය 157 - ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජූනි 07 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 13 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපවන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

අමාත්‍යාංශය විසින් පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශනවල දෙමළ පිටපත දින 25 ක ප්‍රමාදයකින් පසු 2019 මාර්තු 25 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 9.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම කළ යුතු වීම. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන දෙමළ බසට පරිවර්තනය කිරීමේ කටයුතු සිදුකිරීම ප්‍රමාද වූ බව. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම්වල ආරම්භක ශේෂය රු.181,734,104 ක් වුවද, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව ආරම්භක ශේෂය රු.150,466,027 ක් විය. තවද, සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගත් ස්ථාවර වත්කම්වල වටිනාකම රු. 69,481,220 ක් වුවද, ආරම්භක ශේෂයන්ගේ වෙනස හා භාණ්ඩාගාරයේ කරන ලද නිවැරදි කිරීම්වල එකතුව රු. 31,776,671 ක් ගලපා මිලදී ගැනීම් රු.101,257,891 ක් වශයෙන් භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල දක්වා තිබුණි | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හඳුනාගත් වෙනස්කම් නිරවුල් කර නිවැරදි ශේෂයන් දැක්වීමට කටයුතු කළ යුතු වීම. | 2017 වර්ෂයේදී මිලදීගත් මෝටර් රථයේ අගය 2017 වර්ෂයේ ස්ථාවර වත්කම්වලට ඇතුලත් නොකිරීම ආරම්භක ශේෂයේ වෙනසට හේතු වී ඇත. සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් කාර්යාල උපකරණවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොකිරීම මෙම වෙනසට හේතුවී තිබෙන අතර ඒවා නිවැරදි කිරීමට නිලධාරීන් හට උපදෙස් ලබා දී ඇත. |

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අත්තිකාරම් ගිණුමේ ලැබීම් ලෙස දක්වා තිබූ රු.14,618,027 ක ශේෂය තුළ රු.4,564,153 ක් වූ හරස් සටහන් වටිනාකමද ඇතුළත් කර තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී නිවැරදි මූල්‍ය වටිනාකම් හඳුනාගැනීම කළ යුතු වීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීම පිළිබඳ අවබෝධයක් හා පුහුණුවක් නොතිබුණු බව, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට සීමිත කාලයක් තිබූ බව සහ |

4

| | | |
|---|---|---|
| | | ඉදිරියේදී අතපසුවීම් අවම වන ලෙස මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන බව. |
| (ආ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ පැවති රු.8,022,951 ක් වූ බදු නොවන ආදායම් හා වෙනත් ආදායම්වල වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) වෙනත් අමාත්‍යාංශවලින් ලැබූ ප්‍රතිපාදනවලින් දරන ලද පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් පිළිවෙලින් රු.5,266,270ක් හා රු.605,796 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා තිබූ රු.491,106 ක් වූ තැන්පතු ආපසු ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ)රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් කටයුතුවලින් ලැබී තිබුණු රු.10,053,874 ක වටිනාකම සහ නිලධාරීන්ට ගෙවා තිබූ රු.17,503,826 ක වටිනාකම ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයට ගලපා නොතිබුණි. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ලැබීම් හා පොලී, ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයේ දැක්විය යුතු වීම. | -එම- |

### 1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 නොපියවූ අත්තිකාරම් ශේෂය යටතේ වූ 2017 වර්ෂයේ ස්ථාන මාරුවී ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.279,878 ක ණය ශේෂ නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | විධිවිධානවලට අනුකූලව කටයුතු කර ණය ශේෂ නිරවුල් කිරීමට පියවර ගත යුතු වීම. | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත ස්ථාන මාරු වී ගොස් ඇති නිලධාරීන් දෙදෙනාගේ ණය ශේෂ එම අමාත්‍යාංශය සමග සම්බන්ධ වී නිරවුල් කර ගන්නා මෙන් අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී |
| (ආ) සේවය තහනම් කර ඇති සේවකයන් හතර දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 05 වැඩි එකතුව රු.242,820 ක් වූ ණය ශේෂ සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අප්‍රමාදව ණය ශේෂ නිරවුල් කර ගැනීමට පියවර ගත යුතු වීම. | සේවකයින් දෙනෙකුගේ ණය අයකර ගැනීමට දිසා අධිකරණවල නඩු පවරා ඇති බව සහ එක් සේවකයකු සම්බන්ධයෙන් තොරතුරු නොමැති බැවින් එම ණය ශේෂය පොතෙන් ඉවත් කිරීමට ලේකම්ගේ අනුමැතියට යැවීමට කටයුතු කරමින් සිටින බව. |

### 1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබූ බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)ඇප ලේඛනය | | |
| මුදල් රෙගුලාසි 891 (1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි . | මුදල් රෙගුලාසි 891 (1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | ඇප ලේඛනය පවත්වාගෙන යන ලෙස අදාල නිළධාරීන් හට උපදෙස් ලබා දෙන ලදී. |

(ආ) විදුලි උපකරණ පිළිබඳ

ලේඛනය

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 454 (2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි . | මුදල් රෙගුලාසි 454 (2) හි සඳහන් පරිදි රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතු වීම. | ලේඛන පවත්වාගෙන යන යාම හා යාවත්කාලීන කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. |

(ඇ) හානි පිළිබඳ ලේඛනය

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි හි විධිවිධාන 110 යටතේ වන ආකෘතිය ප්‍රකාර හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතු වීම. | -එම- |

### 1.6.6 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | විගණන හා කළමණාකරණ කමිටු තුලින් අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කරන අතර පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රම තවදුරටත් ශක්තිමත් කරන ලෙස අදාල නිලධාරීන් හට උපදෙස් ලබා දෙන ලදී. |

යුතුය. එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 1.6.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 104 (3 ) | වාහන 02 ක් සම්බන්ධයෙන් සිදු වී තිබූ අනතුරු 03 ක් පිළිබඳව විගණිත දිනය වනවිටත් ප්‍රාරම්භක වාර්තා යවා නොතිබුණි. | අලාභ හානියක් සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය කිරීම හා එයට වගකිව යුත්තන් හඳුනාගෙන පරීක්ෂණ ආරම්භ කල යුතු වීම. | අනතුරු සම්බන්ධ ප්‍රාරම්භක වාර්තා 2019 පෙබරවාරි 28 දින මුදල් අමාත්‍යාංශය වෙත යැවීමට පියවර ගෙන ඇත. |
| (ii) මුදල් රෙගුලාසි 1646 | සංචිත වාහන 26 ක් සම්බන්ධයෙන් 2018 ජුනි මාසයේ සිට දෙසැම්බර් දක්වා වූ දෛනික ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව නියමිත කාලයේදී ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත්කල යුතු වීම. | ධාවනසටහන් පොත් යාවත්කාලීන කොට නියමිත කාලයේදී විගණනය සඳහා ඉදිරිපත් කිරීමට නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලදී. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.3 ඡේදය | චක්‍රලේඛයේ ආකෘතිය ප්‍රකාරව ප්‍රවාහන සේවා පිළිබඳ වාර්තා සකස් කර නොතිබුණි. | චක්‍රලේඛයට අනුකූලව වාර්තා පවත්වාගෙන යා යුතු වීම. | මේ වන විට ප්‍රවාහන සේවා පිළිබඳ ලේඛනයක් සකසා යාවත්කාලීන කරමින් පවත්වා ගෙන යනු ලැබේ. |
| (ඇ) 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය අවසානයට වටිනාකම රු.251,215,324 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තාකර නොතිබුණි. | ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තාකල යුතු වීම. | 2018 දෙසැම්බර් මාසය දක්වාම ස්ථාවර වත්කම් පරිගණක ගත කිරීම සිදුවූ බැවින් කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තාව ඉදිරිපත් කිරීමට නොහැකි වුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මූලධන වැය විෂයයන් 3 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 1.80 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ඉටුවන පරිදි වාර්ෂික වැය විෂය ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | ඉල්ලුම් කරන ලද අග්‍රිම නොලැබීම ඉතිරියට හේතු වීඇත. |
| (ආ) පුනරාවර්තන වැය විෂයයන් 5 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 14.71 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.මිලියන 11.17 ක් පමණක් උපයෝජනය කිරීම නිසා රු. මිලියන | -එම- | සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට නොහැකි වීම සහ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා වූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් හා සබරගමුව පළාත් මධ්‍යස්ථානය වසා දැමීම යන හේතු මත |

| | | |
|---|---|---|
| 3.54 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 22 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | | පුනරාවර්තන ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |
| (ඇ) මූලධන වැය විෂයයන් 09 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 294.60 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු. මිලියන 182.68 ක් පමණක් උපයෝජනය කිරීම නිසා රු.මිලියන 111.92 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ක සිට සියයට 76 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.. | -එම- | ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා කාර්යාලීය උපකරණ ලබා ගැනීමට අක් මුදල් නොලැබීම හා අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් ආයතන සඳහා අක්මුදල් නොලැබීම හා නව බඳවා ගැනීම සිදු නොවීම යන හේතු මත ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදල රු.මිලියන 14.20 ක් ලෙස දක්වා තිබුණි. එහෙත් අමාත්‍යාංශයේ බැරකම් ප්‍රකාශය අනුව එම මුදල රු.මිලියන 2.22 ක් අඩුවෙන් රු.මිලියන 11.97 ක් වශයෙන් දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව බැදීම හා බැරකම සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම. | පෙර වර්ෂයේ බැදීම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට කඩිනමින් වාර්තා කල යුතුව තිබූ බැවින් දළ වශයෙන් ඉතිරිවූ ප්‍රතිපාදන ප්‍රමාණය බැරකම් වශයෙන් පෙන්නුම් කිරීමට කටයුතු කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සහජීවන සංගම් වෙත බෙදාහැරීම සඳහා 2017 දෙසැම්බර් 29 දින මිලදී ගෙන තිබූ පුටු 7500 න් රු. 561,104 ක් වටිනා පුටු 775 ක් 2019 මැයි 27 දින වනවිටත් බෙදා නොහැර ඉතිරිව තිබුණි. | සැලසුම් කරන ලද කාලය තුලදී අදාල වැඩසටහන් ක්‍රියාත්මක කර නිමකල යුතු වීම. | 2019 අප්‍රේල් 21 දින සිදුවූ කලබලකාරී වාතාවරණය මත ඉතිරි පුටු බෙදා දීමට නොහැකි වූ අතර ඉදිරි මාසවලදී එම පුටු සහජීවන සංගම් වෙත බෙදාහැරීමට කටයුතු සැලසුම් කර ඇත. |

### 3.2 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2018 ජූලි 01 දින අනතුරකට ලක් වී තිබූ මිට්ෂුබිසි ඩබල් කැබ් රථය 2019 මැයි මාසය දක්වාම අළුත්වැඩියා කටයුතු සිදු කර ගැනීමකින් තොරව නියෝජිත ආයතනයේ ගරාජයේ ගාල් කර තිබුණි. මෙම අනතුර සම්බන්ධයෙන් කඩිනම් මූලික පරීක්ෂණ කටයුතු නොකිරීම හේතුවෙන් සිදු වූ අලාභය අය කර ගැනීමට තිබූ අවස්ථාව මග හැරී තිබුණි. | වාහන අනතුරු සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අලාභයන් අයකර ගැනීමට හැකිවන පරිදි මුදල් රෙගුලාසි ප්‍රකාරව වූ පරීක්ෂණය කඩිනමින් සිදු කළ යුතු වීම. | වාහනයේ අලුත් වැඩියා කටයුතු සඳහා අවශ්‍ය air bag සහ ආසන පටි ජර්මනියෙන් ආනයනය කරන තුරු අළුත්වැඩියා කටයුතු නිම කිරීමට තරමක කාලයක් ගත වේ. |

| | | |
|---|---|---|
| (ආ) 2018 ඔක්තෝබර් මාසයේදී මිලදීගත් රු.මිලියන 32.7 ක් වටිනා BMW වර්ගයේ මෝටර් රථය පළමු ධාවන අවස්ථාවේදීම ටයර්වලට සිදු වී තිබූ හානිය හේතුවෙන් රු.570,296 ක් වැය කර 2018 දෙසැම්බර් මාසයේදී නියෝජිත ආයතනයෙන් අළුත්වැඩියාව කරගෙන තිබුණි. 2019 ජනවාරි මාසයේදී නැවත ධාවනයේ යෙදවීමේදී, වාහනයට නියමිත ඉන්ධන වෙනුවට වෙනත් ඉන්ධන වර්ගයක් භාවිතා කිරීම හේතුවෙන් සිදු වූ දෝෂය අළුත්වැඩියා කිරීම සඳහා 2019 මැයි මාසයේදී රු.මිලියන 1.08 ක වියදමක් දරා තිබුණි. මෙම අළුත්වැඩියා දෙකටම අදාළ සිද්ධීන් තාවකාලික පත්වීම් ලත් නිලධාරීන් දෙදෙනෙකු අතින් සිදු වී තිබූ බව අනාවරණය විය. | වාහන අනතුරු හෝ දෝෂයන් ඇති වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කඩිනමින් පරීක්ෂණයන් සිදු කර අලාභයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | එම අලාභයන්ට අදාළව ප්‍රාරම්භක වාර්තා සකස් කර යවා ඇත.එම රථය මේ වන විට අළුත්වැඩියාව සඳහා යොමු කර ඇති අතර අළුත්වැඩියා කිරීමට ඇස්තමේන්තුගත මුදල රු.1,089,788 ක් වේ. මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට පියවර ගන්නා ලෙස දැනුම් දී ඇත. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාර සේවයේ III වන පන්තියේ නිලධාරීන් 110 ක් බඳවා ගැනීම සඳහා 2017 හා 2018 වර්ෂයන්හිදී අයදුම්පත් කැඳවා තිබුණි. බඳවා ගැනීමේ කටයුතු සඳහා රු. මිලියන 3.47 ක් වැයකර තිබුණද, 2019 මැයි 28 දින දක්වාම බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීම කඩිනම් කළ යුතු වීම. | ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක විභාගයේ ලිඛිත කොටස 2018 සැප්තැම්බර් 16 දින ද වාචික කොටස 2019 පෙබරවාරි 25 දින ද පවත්වන ලද අතර එහි ප්‍රතිඵල ලද පසුව සම්මුඛ පරීක්ෂණය පවත්වා බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. |

# හතර වන පරිච්ඡේදය
# කාර්ය සාධන දර්ශක

# **4.1** ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| 4.1 පාලන අංශය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | ක්‍රියාකාරකම් | | මුදල්වෙන් කිරීම් (මිලි.) | මූලාප් රගතිය | අපේක්ෂිතනිමැයුම් වල % ලෙස තත්‍ය නිමැයුම් | | | |
| | | | | | 100%-90% | 75%-89% | 50%-74% | 50% ට වඩාඅඩු |
| 1 | කාර්යාල කළමනාකරණය | | | | | | | |
| | 1.1 | කාර්යාලීය ඉඩකඩ කළමනාකරණය, උපයෝගීතා බිල්පත්, ආරක්ෂක හා පවිත්‍රතාසේවා පවත්වාගෙන යාම | | | 100% | | | |
| | 1.2 | දෛනිකතැපැල් කටයුතු පවත්වාගෙන යාම | | | 100% | | | |
| | 1.3 | අමාත්‍යාංශයේ වෙබ් අඩවිය පවත්වාගෙන යාම | | | 90% | | | |
| | 1.4 | තොරතුරු දැනගැනීමේ අයිතිය සම්බන්ධීකරණය (RTI) | | | 100% | | | |
| | 1.5 | අමාත්‍යමණ්ඩල පත්‍රිකා සම්බන්ධකරණය | | | 100% | | | |
| 2 | පුද්ගල කළමනාකරණය | | | | | | | |
| | 2.1 | සේවක සංඛ්‍යා කළමනාකරණය | | | | 75% | | |
| | 2.2 | පුද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම | | | | 75% | | |
| | 2.3 | නිදහස් දුම්රිය බලපත්‍ර, සිසන් පත්, අග්‍රහාර රක්ෂණ, ආපදා ණය, උත්සව අත්තිකාරම් ආදිය | | | 100% | | | |
| | 2.4 | රජයට අයත් ව්‍යවසායන්හි අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීමට අදාල කටයුතු සමීක්ෂණය | | | 100% | | | |
| 3 | පුහුණු හා සංවර්ධන | | | | | | | |
| | 3.1 | පුහුණු සැලසුම සකස් කිරිම | | | 100% | | | |
| | 3.1.1 | පුහුණු සැලසුම ක්‍රියාත්මක කිරීම - දේශීය පුහුණු | | | 90% | | | |
| | 3.1.2 | පුහුණු සැලසුම ක්‍රියාත්මක කිරීම - විදේශීය පුහුණු | | | 90% | | | |
| 4 | වාහන සමූහයකළමනාකරණය | | | | | | | |
| | 4.1 | වාහන බලපත්‍ර හා රක්ෂණ අළුත් කිරීම | | | | | | |
| | 4.2 | වාහන නඩත්තු කිරිම හා සේවා කිරීම | | | | | | |
| 5 | අමාත්‍යවරයා , නියෝජ්‍ය අමාත්‍යවරයා, අමාත්‍යකාර්යාලය සඳහා පහසුකම් සැලසීම | | | | 100% | | | |

| **4.2 ගිණුම් අංශය** | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | ක්‍රියාකාරකම | | මුදල් වෙන් කිරීම | මූල්‍ය ප්‍රගතිය | අපේක්ෂිත නිමැවුම් වල නිමැයුම්තත්‍ය % | | | |
| | | | | | 50% ට වඩා අඩු | 50%-74% | 75%-89% | 100%-90% |
| 1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම | | | | | | | |
| | 1.1 | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම | 1 | 1 | | | | 100% |
| | 1.2 | අත්තිකාරම් බි ගිණුම පිළියෙල කිරීම | 1 | 1 | | | | 100% |
| 02 | වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම | | 1 | 1 | | | | 100% |
| 03 | වෙනත් වාර්තා පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම | | | | | | | |
| | 3.1 | වාර්ෂික අග්‍රිම යෙදවුම් හා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කිරීම | 1 | 1 | | | | 100% |
| | 3.2 | අධිකාරි බලය පැවරීමේ සීමා පිළියෙල කිරීම | 1 | 1 | | | | 100% |
| | 3.3 | මාසික සාරාංශය | 12 | 11 | | | | 92% |
| | 3.4 | බැංකු සැසඳුම් | 12 | 11 | | | | 92% |
| | 3.5 | අග්‍රිම යෙදවුම් | 12 | 12 | | | | 100% |
| | 3.6 | අතැති බිල්පත් වාර්තාව | 12 | 12 | | | | 100% |
| | 3.7 | වියදම් වාර්තාව | 12 | 11 | | | | 92% |
| | 3.8 | අග්‍රිම සැසඳුම් | 4 | 3 | | | 75% | |
| | 3.9 | ආදායම් වාර්තාව | - | - | | | | |
| | 3.10 | හිඟ ආදායම් වාර්තාව | - | - | | | | |
| | 3.11 | තැන්පතු සැසඳීම | 1 | 1 | | | | 100% |
| | 3.12 | වාර්ෂික උපයන විට ගෙවීමේ බදු සැසඳීම | 1 | 1 | | | | 100% |
| 04 | ගෙවීම් | | | | | | | |
| | 4.1 | වැටුප් ගෙවීම | 12 | 11 | | | | 92% |
| | 4.2 | වෙනත් ගෙවීම් | 12 | 11 | | | | 92% |
| 05 | වත්කම් කළමනාකරණය | | | | | | | |
| | 5.1 | වත්කම් පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීම | 1 | 1 | | | | 100% |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 5.2 | ගබඩා කළමනාකරණය | 1 | 1 | | | | 100% |
| | 5.3 | වත්කම් ලේඛණ හා භාණ්ඩ වට්ටෝරු ලේඛණ යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | | | | | | |
| 6 | වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම | | | | | | | |
| 7 | ප්‍රසම්පාදනය | | 1 | 1 | | | | 100% |
| | 7.1 | ප්‍රසම්පාදන සැලසුම සකස් කිරීම හා ඉදිරිපත් කිරීම | | | | | | |

**4.3** **භාෂා අංශය**

| අනු අංකය | ක්‍රියාකාරකම | මුදල් වෙන් කිරීම | මුල්‍ය ප්‍රගතිය | අපේක්ෂිත නිමැවුම් වල නිමැයුම්තත්‍ය % | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 50% ට වඩා අඩු | 50%-74% | 75%-89% | 100%-90% |
| 1 | භාෂා සංවර්ධන වැඩසටහන | 42.00 | 38.03 | | | 80% | |

**4.4** **ජාතික ඒකාබද්ධතා අංශය**

| අනු අංකය | ක්‍රියාකාරකම | මුදල් වෙන් කිරීම | මුල්‍ය ප්‍රගතිය | අපේක්ෂිත නිමැවුම් වල නිමැයුම්තත්‍ය % | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 50% ට වඩා අඩු | 50%-74% | 75%-89% | 100%-90% |
| 1 | සහජීවනය ප්‍රවර්ධනය කිරීම | 125.00 | 95.75 | | | 75% | |

| 4.5 සැලසුම් අංශය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | ක්‍රියාකාරකම | | මුදල් වෙන් කිරීම(රු.මි ) | මූල්‍ය ප්‍රගතිය | අපේක්ෂිත නිමැවුම් වල නිමැයුම්තත්‍ය % | | | |
| | | | | | 50% ට වඩා අඩු | 50%-74% | 75%-89% | 100%-90% |
| 1 | වාර්තා ඉදිරිපත් කිරීම | | 1.20 | 2.49 | | | | 100% |
| | 1.1 | වාර්ෂික කාර්යසාධන වාර්තාව 2018 | | | | | | 100% |
| | 1.2 | වාර්ෂික ප්‍රගති වාර්තාව 2019 | | | | | | |
| | ප්‍රගතිය අධික්ෂණය | | 0.80 | | | | | |
| | 2.1 | අමාත්‍යාංශ යටතේ ඇති අංශ වල ප්‍රගතිය | - | | | | 80% | |
| | 2.2 | අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල ප්‍රගතිය | - | | | | 80% | |
| 03 | ජාතික මට්ටමේ වැඩසටහන් නියෝජනය කිරීමේ ක්‍රියාකාරකම් | | 1.00 | | | | 80% | |
| 04 | සංහිඳියාව අරමුණු කරගත් ආර්ථික සවිබල ගැන්වීමේ ව්‍යාපෘති 1හා 2 | | 1288.00 | 732.27 | | | 80% | |
| 05 | දිස්ත්‍රික් සංහිඳියා කමිටු | | 75.00 | 39.64 | | | 80% | |
| 06 | සංවර්ධන සහය ව්‍යාපෘතිය | | 375.00 | | | 50% | | |

| 4.6 අභ්‍යන්තර විගණන අංශය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | ක්‍රියාකාරකම | මුදල් වෙන් කිරීම | මූල්‍ය ප්‍රගතිය | අපේක්ෂිත නිමැවුම් වල නිමැයුම්තත්‍ය % | | | |
| | | | | 50% ට වඩා අඩු | 50%-74% | 75%-89% | 100%-90% |
| 1 | වාර්ෂික අභ්‍යන්තර විගණන විමසුම් පිළියෙළ කිරීම හා ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම | - | - | | | | 90% |
| 2 | කාර්තුමය ඇගයුම් වාර්තා පිළියෙල කිරීම | | | | | | 100% |
| 3 | විගණන කළමනාකරණ රැස්වීම් කමිටු පැවැත්වීම | | | | | | 100% |
| 4 | රජයේ ගිණුම්කාරක සභාවේ රැස්වීම් සඳහා සහභාගිවීම හා සාමාන්‍ය විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම සම්බන්ධිකරණය | | | | | | 90% |

# පස්වන පරිච්ඡේදය

# තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 ආයතනයට අදාළ හඳුනාගත් තිරසර සංවර්ධන අභිමතාර්ථ

- ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා සමාජ ප්‍රගති හා හින්දු ආගමික අමාත්‍යාංශය

| අනු අංකය | අභිමතාර්ථ/අරමුණු | ඉලක්ක | ලඟාකර ගැනීමේ දර්ශක | ප්‍රතිශතය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% -74% | 75% -100% |
| 01 | ජාතික ඒකාබද්ධතා අංශය | | | | | |
| | SGD 16 .a සාමකාමී හා පරිපූර්ණ සමාජයක් බිහි කිරීම හා යුත්තිය සඳහා සැමට අවස්ථාව සලසා දීම | වෙනස් කොට සැලකීම වැළැක්වීම සඳහා වූ නීති හා ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම හා සවිබල ගැන්වීම | ජාතික ඒකාබද්ධතා ප්‍රතිපත්තිය පිළිගැන්වීම | 40% | | |
| 02 | භාෂා අයිතවාසිකම් අංශය | | | | | |
| | SGD 16 සැමට කාර්යක්ෂම, විනිවිදභාවයෙන් යුතු සේවාවක් | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම | නිවැරදි කළ භාෂා නාම පුවරු සංඛ්‍යාව<br><br>පවත්වන ලෙස පුහුණු වැඩසටහන් ගණන | | | 80% |

- අමාත්‍යාංශය යටතේ පැවැති ආයතන

| අනු අංකය | අභිමතාර්ථ/අරමුණු | ඉලක්ක | ලඟාකර ගැනීමේ දර්ශක | ප්‍රතිශතය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% -49% | 50%-74% | 75%-100% |
| 01 | **රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව** | | | | | |
| | SGD 04 ගුණාත්මකභාවයෙන් යුත් අධ්‍යාපන ලඟාකර ගැනීමට සැමට අවස්ථාව සලසාදීම | ජාතික හා ජාත්‍යන්තර භාෂා පුහුණු කිරීම<br><br>රජයේ නිල භාෂා පරිවර්තක ලෙස කටයුතු කිරීම | | | 70% | |
| 02 | රාජ්‍ය භාෂා කොමිසම | | | | | |
| | SGD 16 සැමට කාර්යක්ෂම, විනිවිදභාවයෙන් යුතු සේවාවක් | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම | සිදු කරන ලද භාෂා විගණන ගණන ලද භාෂා පැමිණිලි සංඛ්‍යාව | | | 80% |
| 03 | ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය | | | | | |
| | SGD 04 ගුණාත්මකභාවයෙන් යුත් අධ්‍යාපන ලඟාකර ගැනීමට සැමට අවස්ථාව සලසාදීම | ද්වි භාෂාවෙන් සේවය කළ හැකි රාජ්‍ය සේවකයන් බිහි කිරීම<br><br>ද්වි භාෂා ගුරුවරුන් පුහුණු කිරීම | පුහුණුව ලද රාජ්‍ය සේවකයන් ගණන<br><br>පුහුණු ලද ගුරුවරුන් ගණන | | | 90% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 04 | රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ලේකම් කාර්යාලය | | | | | |
| | SGD 17 ජාතික හා ජාත්‍යන්තර සබඳතාවය ආයතන ක්‍රියාත්මක කිරීමට යොදා ගැනීම | රාජ්‍ය නොවන සංවිධාන විධිමත් පරිදි අධීක්ෂණය සිදු කිරීම<br><br>ක්ෂුද්‍රමූල්‍ය පනත සංශෝධනය කිරීම | සිදු කරන ලද අධීක්ෂණ චාරිකා ගණන<br><br>නව ක්ෂුද්‍රමූල්‍ය පනත එළිදැක්වීම | | 50% | |
| 05 | හින්දු කටයුතු දෙපාර්තමේන්තුව | | | | | |
| | SGD 04 ගුණාත්මකභාවයෙන් යුත් අධ්‍යාපන ලභාකර ගැනීමට සැමට අවස්ථාව සලසාදීම | දහම් අධ්‍යාපනය තුළින් හින්දු දරුවන් සවිබල ගැන්වීම | ලියාපදිංචි දහම් පාසල් ගණන<br><br>ක්‍රියාත්මක කළ ව්‍යාපෘති ගණන<br><br>ප්‍රතිලාභී දරුවන් ගණන | | 60% | |
| 06 | ජාතික සමඟිය සංහිදියා කාර්යාලය | | | | | |
| | SGD 16 .a සාමකාමී හා පරිපූර්ණ සමාජයක් බිහි කිරීම හා යුත්තිය සඳහා සැමට අවස්ථාව සලසා දීම | සාමකාමී පරිසරයක් නිර්මාණය කිරීම වෙනුවෙන් වූ ව්‍යාපෘති ඉටු කිරීම | ඉටු කළ ව්‍යාපෘති ගණන | | 50% | |
| 07 | අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය | | | | | |
| | SGD 16 .a සාමකාමී හා පරිපූර්ණ සමාජයක් බිහි කිරීම හා යුත්තිය සඳහා සැමට අවස්ථාව සලසා දීම | අතුරුදහන් වූවන් වෙනුවෙන් ඔවුන්ගේ පවුල් වලට සහන සැලසීම | සහන සැලසූ පවුල් ගණන | 10% | | |

# හයවන පරිච්ඡේදය

# මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමතසේවක සංඛ්‍යාව | පවතිනසේවක සංඛ්‍යාව | අබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 27 | 12 | 15 |
| තෘතීයික | 6 | 2 | 4 |
| ද්විතියික | 432 | 253 | 179 |
| ප්‍රාථමික | 96 | 80 | 16 |
| **මුළුඑකතුව** | **561** | **347** | **214** |

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහන ේ කාල සීමාව | සමස්ථ ආයෝජනය රු. 000) | | වැඩ සටහන ස්වභාවය (දේශීය / විදේශීය) | නිමැවුම / ලබා ගත් දැනුම * |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 1 | මූලික /උසස් දෙවන භාෂා පාඨමාලාව | 13 | 2019.02.07 | නොමිලේ | | දේශීය | ආයතනයේ ඉලක්ක හා අරමුණු ලබා කර ගැනීම සඳහා මානව සම්පතෙහි දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කර ගැනීම තුලින් නිලධාරීන්ගෙ කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ආයතනයට ලබා දීම. |
| 2 | සිංහල/ඉංග්‍රීසි/ දෙමළ භාෂා ඉගැන්වීම් පිළිබඳ ගුරු පුහුණු වැඩමුළුව | 2 | 2019.01.17 සිට 2019.01.21 දක්වා | නොමිලේ | | දේශීය | |
| 3 | සරප්/මුදල් අයකැම් තනතුරේ කාර්යභාරය හා වගකීම | 1 | 2019.01.21 | 5,000.00 | - | | |
| 4 | ස්ත්‍රී/පුරුෂ සමාජභාවය වැඩමුළුව | 4 | 2019.01.25 | නොමිලේ | | දේශීය | |
| 5 | දේපල/උපකරණ සබැදීව ස්ථාවර වත්කම් පවත්වාගෙන යාම හා නඩත්තු කිරීම | 2 | 2019.01.29 | 5,000.00 | - | දේශීය | ආයතනයේ ඉලක්ක හා අරමුණු ලබා කර ගැනීම සඳහා මානව සම්පතෙහි දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කර |
| 6 | සංහිඳියා යන්ත්‍රණ පිළිබඳව සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය | 50 | 2019.02.18 | නොමිලේ | | දේශීය | |
| 7 | පෞද්ගලික ලිපිගොනු කළමනාකරණය | 3 | 2019.02.14 හා 2019.02.15 | 39,000.00 | - | දේශීය | |
| 8 | කාර්යාල ක්‍රම, කළමනාකරණය සහ නිවාඩු පිළිබඳ පුහුණු පාඨමාලාව | 70 | 2019.02.28 | 44,275.00 | - | දේශීය | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 9 | ආයතන සංග්‍රහයේ විධිවිධාන | 2 | 2019.03.14 හා 2019.03.15 | නොමිලේ | | දේශීය | ගැනීම තුලින් නිලධාරීන්ගෙ කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ආයතනය වලට ලබාදීම. |
| 10 | මූලික ගිණුම්කරණ සංකල්ප හා ගිණුම්කරණ ප්‍රමිත | 4 | 2019.03.14 සිට 2019.03.15 | 34,000.00 | - | දේශීය | |
| 11 | බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය | 1 | 2019.05.27 හා 2019.05.28 | 8,500.00 | - | දේශීය | |
| 12 | ICT (මූලික පරිගණක පුහුණුව) | 5 | 2019.06.03 හා 2019.06.04 | 65,000.00 | - | දේශීය | |
| 13 | අත්තිකාරම් බී ගිණුම පිළිබඳ වැඩමුළුව | 3 | 2019.06.04 | 15,000.00 | - | දේශීය | |
| 14 | දෙමළ ඩිප්ලෝමාව | 1 | 2019.06.28 | 16,500.00 | - | දේශීය | |
| 15 | ඵලදායී කළමනාකරණ නිපුණතා | 1 | 2019.06.20 හා 2019.06.21 | 8,500.00 | - | දේශීය | |
| 16 | යන්ත්‍රසූත්‍ර හා රථවාහන පරිපාලනය | 2 | 2019.06.24 හා 2019.06.25 | 12,000.00 | - | දේශීය | |
| 17 | නව විගණන පනත | 80 | 2019.06.24 | 52,400.00 | - | දේශීය | |
| 18 | තොග පාලනය පිළිබඳ පාඨමාලාව | 1 | 2019.06.27 හා 2019.07.26 | 18,000.00 | - | දේශීය | |
| 19 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය | 1 | 2019.07.18 හා 2019.07.19 | 13,000.00 | - | දේශීය | |
| 20 | Government Pay Roll System | 1 | 2019.07.31, 2019.08.01 හා 2019.08.02 | 18,000.00 | - | දේශීය | ආයතනයේ ඉලක්ක හා අරමුණු ලඟා කර ගැනීම |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 21 | මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ විද්වත් දේශනය | අමාත්‍යාංශය ේසියළු නිලධාරීන් | 2019.07.30 | 5,630.00 | - | දේශීය | සඳහා මානව සම්පතෙහි දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කර ගැනීම තුලින් නිලධාරීන්ගෙ කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ආයතනයට ලබාදීම. |
| 22 | අමාත්‍යාංශ සංදේශ පුහුණුව | 1 | 2019.07.09 හා 2019.07.23 | 7,800.00 | - | දේශීය | |
| 23 | ඉංග්‍රීසි ඩිප්ලෝමාව - II අදියර | 1 | 2019.08.28 | 25,000.00 | - | දේශීය | |
| 24 | ව්‍යාපෘති යෝජනා සැකසීම පිළිබඳ වැඩමුළුව | 25 | 2019.08.20 , 2019.08.21 | 168,000.00 | - | දේශීය | |
| 25 | මානසික සුවතාවය සඳහා සතිමත් බව | 100 | 2019.08.29 | 15,400.00 | - | දේශීය | |
| 26 | විදේශ නිවාඩු පිළිබඳ වැඩමුළුව | 2 | 2019.09.09 | 10,000.00 | - | දේශීය | |
| 27 | නිවාඩුපිළිබඳ වැඩමුළුව | 2 | 2019.09.17 | 7,600.00 | - | දේශීය | |
| 28 | Advanced Excel Programme | 2 | 2019.09.19 හා 2019.09.20 | 34,000.00 | - | දේශීය | |
| 29 | විශ්‍රාම වැටුප් ක්‍රමය | 4 | 2019.09.04 | 15,200.00 | - | දේශීය | |
| 30 | බැහැරගතක්‍රියාශීලී වැඩමුළුව | 100 | 2019.09.29 | 348,376.00 | - | දේශීය | |
| 31 | ව්‍යාපෘති යෝජනා සැකසීම (නේවාසික ගාස්තු) | 14 | 2019.08.20 හා 2019.08.21 | 23,800.00 | - | දේශීය | |
| 32 | විද්වත් දේශනය | 100 | 2019.10.01 | 6,900.00 | - | දේශීය | |
| 33 | විද්වත් දේශනය- තොරතුරු පනත | 120 | 2019.10.16 | 10,090.00 | - | දේශීය | |
| 34 | බැහැරගත වැඩමුළුව සඳහා සහතිකපත් ප්‍රදානය කිරිම | 100 | 2019.09.29 | 17,000.00 | - | දේශීය | |
| 35 | කාර්යාල කළමනාකරණය පිළිබඳ වැඩමුළුව | 45 | 2019.11.14 | 13,225.00 | - | දේශීය | |
| 36 | දෙමළ ඩිප්ලෝමාව | 1 | 2019.08.18 | 23,000.00 | - | දේශීය | |
| 37 | කා.කා.ස.සඳහා වැඩමුළුව | 16 | 2019.12.07 | 64,000.00 | - | දේශීය | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 38 | දෙමළ මූලික පාඨමාලාව | 16 | 2019.09.23 සිට 2019.12.10 දක්වා | 18,400.00 | - | දේශීය | |
| 39 | International Programme on Management | 2 | 2019.03.17 සිට 2019.03.24 දක්වා | 500,000.00 | - | විදේශීය | |
| 40 | Technical Exchange Mission | 2 | 2019.02.17 සිට 2019.03.03 | ඩොලර් 2850 හා පවුම් 150 | - | විදේශීය | ආයතනයේ ඉලක්ක හා අරමුණු ලහා කර ගැනීම සඳහා මානව සම්පතෙහි දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කර ගැනීම තුලින් නිලධාරීන්ගෙ කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ආයතනයට ලබාදීම. |
| 41 | 2019 Seminar on Ethnic Policies and Practices for Developing Countries | 2 | 2019.08.16 සිට 2019.09.05 | පවුම් 150 | - | විදේශීය | |
| 42 | Seminar on China's Development Experience Policies for Sri Lanka | 1 | 2019.09.01 to 2019.10.02 | ඩොලර් 1200 හා පවුම් 75 | - | විදේශීය | |
| 43 | Invitation for Capacity Development Measure | 3 | 2019.09.22 to 2019.09.27 | ඩොලර් 600 | - | විදේශීය | |
| 44 | The Iclusion Mobility and Multilingual Education | 2 | 2019.09.23 to 2019.09.26 | ඩොලර් 120 | - | විදේශීය | |
| | | | | | | | |
| | * ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. | | | | | | |
| | | | | | | | |
| | ආයතනයේ ඉලක්ක හා අරමුණු ලහා කර ගැනීම සඳහාමානව සම්පතෙහි දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කර ගැනීම තුලින් | | | | | | |
| | නිලධාරීන්ගෙන් කාර්යක්ෂමහා ඵලදායී සේවාවක්ආයතනයටලබාදීම. | | | | | | |

# සත්වන පරිච්ඡේදය

# අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.6 | වෙනත්(කුලී අත්තිකාරම්ගිණුම) | අනුකූල වේ | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේක267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල නොවේ | විවිධ අංශ මඟින් පිළිතුරු ලබා ගෙන අවසාන පිළිතුර සකස් කිරීමට සිදුවන බැවින් | විගණන විමසුම් සඳහා ප්‍රමුඛතාවය දක්වන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | යම් යම් අවස්ථාවල දී පිළිතුරු යැවීමට ප්‍රමාද වේ. | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | විවිධ අංශ මගින් පිළිතුරු ලබා ගෙන අවසාන පිළිතුර සකස් කිරීමට සිදුවන බැවින් යම් යම් අවස්ථාවල දී පිළිතුරු යැවීමට ප්‍රමාද වේ. | විගණන විමසුම් සඳහා ප්‍රමුඛතාවය දක්වන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත. |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | වාර්තාකර තිබීම | | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛඅංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | දුරස්ථභාවය හේතු කොට ගෙන උතුරු පළාත් මධ්‍යස්ථානයේ (කිළිනොච්චිය)වාර්තා ලැබීමට ප්‍රමාද විය | ඉදිරි වර්ශ වලදී අමාත්‍යාංශයේ නිලධාරීන් මඟින් සිදු කිරීමට සැලසුම් කර ඇත |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම | අනුකූල වේ | | |
| 12 | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | ගෙවීම් පැහැර හැරීම | නීතිමය කටයුතු සඳහා ඉදිරිපත්කර ඇත |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර  පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | නිලධාරීන්ගේ කාර්ය බහුලත්වය සහ වෙනත් ප්‍රායෝගික හේතූන් | ප්‍රමුඛතාවය දක්වන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ | - | | |

| | | | | |
|---|---|---|---|---|
| | ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | | | |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | - | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | - | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | - | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | | | |

| | | | | |
|---|---|---|---|---|
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | | | |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |